# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 84 — 1973 නොවැම්බර් 02 වැනි සිකුරාදා — 1973.11.02

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 1093 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1097 | අයවැය ලේඛන ... ... ... | 1102 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | 1105 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 1100 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 1105 |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත 1973 නොවැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩ බලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම මෙම නිවේදනයෙන් :—

(1) කළුතර දිස්ත්‍රික්කයේ ඉද්දගොඩ පත්තුවේ හොරවල සහ දොඩම්ගොඩ ගම් ප්‍රදේශවල පිහිටි දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ නව ඡන්ද කොට්ඨාශවලට බෙදීම සම්බන්ධයෙන්, 1964 ජූලි 10 වන දින හා අංක 14,102 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය, එහි පළමුවන උපලේඛනයේ "හොරවල ගම්ප්‍රදේශය" යන ශීර්ෂය යටතේ එන සියලුම කරුණු වෙනුවට, මෙහි උපලේඛනයේ සඳහන් කරුණු, පළමුවු සඳහන් කරන ලද උපලේඛනයේ නියමිත තීරණයන්හි සඳහන් කරනු ලැබීමෙන් සංශෝධනය කරමි.

තවද,

(2) මෙම නිවේදනයේ සඳහන් විධිවිධාන—

(අ) ඒවා 1971 වර්ෂයේ පවත්වනු ලබන ඉහත කී හොරවල ගම්ප්‍රදේශයේ ගම්සභාවට සභිකයන් තෝරා පත් කර ගැනීමේ මහා ඡන්ද විමසීමට සම්බන්ධවූ කරුණකට අදාළ වන ප්‍රමාණයට, මෙම නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතුය; තවද

(ආ) මේ විධිවිධාන වෙනත් යම් කරුණකට අදාළ වන ප්‍රමාණයට, නිලයෙහි සිටින ඉහත කී ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සභිකයන්ගේ නිල කාලය අවසන් වන දිනයට ඉක්බිතිවම එළඹෙන දිනයෙහි සිට ක්‍රියාත් විය යුතු බවද ප්‍රකාශ කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩ බලන අමාත්‍ය.

1973 ඔක්තෝබර් මස 1 දින,
කොළඹ දී ය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## උපලේඛනය

### හොරවල ගම් ප්‍රදේශය

| දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ | නව ඡන්ද කොට්ඨාශ |
|---|---|
| අංක 794—හොරවල ... | අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය—හොරවල නැගෙනහිර: හොරවල-පැලවත්ත මහා මාර්ගයෙන් නැගෙනහිරට පිහිටි හොරවල ගමේ ඇල්ලමුල්ල, මාකමුල්ල, කමතගොඩ, මිල්ලගහවත්ත, පෙත්තවත්ත, ගොඩේවත්ත, පින්වලඹිවිටි (කොටසක්) මූල්ලකන්දවත්ත (කොටසක්) කලුඇලිය යන ගම් කොටස් සහ ඩෙනිස්ටන් වත්තේ කොටසකින් සමන්විත වේ. |
| | අංක 2 දරන ඡන්ද කොට්ඨාශය—හොරවල මධ්‍යම: හොරවල—පැලවත්ත මහා මාර්ගයෙන් බටහිරට පිහිටි මූල්ලකන්දවත්ත (කොටසක්), පන්වලඹිට (කොටසක්), මානගොඩ බෝගොඩ ගල්වල, කිතුල්ගොඩවත්ත, පුවක් ගහලියද්ද, පැලකැටියාගොඩ, ගල්බඩවත්ත, තල්ලගහවත්ත, හබුරුවාගොඩ, කැරත්තවල, වෙදගොඩ, වතුමුල්ල, බැල්ලමාදල, කුරුඳුවත්ත, මානාන යන ගම් කොටස් සහ ඩෙනිස්ටන් වත්තේ කොටසකින් සමන්විතය. |
| | අංක 3 දරණ ඡන්ද කොට්ඨාශය—හොරවර බටහිර: හොරවල ගමේ කවුවාලගොඩ, මාවතගොඩ, වඳේවත්ත, දියඋල්පත, දික්හේන මහවත්ත, හොරවලවත්ත, දියකිතුලගොඩ ආදී ගම් කොටස් වලින් සමන්විත වේ. |
| අංක 798—ඔව්විගල-බදුගම ... | අංක 4 දරණ ඡන්ද කොට්ඨාශය—ඔව්විගල: මතුගම සුළු නගර සභා සීමාවෙන් බාහිරව පිහිටි ඔව්විගල ගමේ මතුගම—අලුත්ගම මහා මාවතෙන් නැගෙනහිර අංශයේ කොටසකින් සමන්විත වේ. |
| | අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය—බදුගම: බදුගම ගමේ රච්චිලිගොඩ, තම්බෙගොඩවත්ත, කොකාකන්ද, කොකාවල දෙණිය, බඩද්දරයාවත්ත, දියකිතුලකන්ද, ක්ලැරන්ස් හිල්වත්ත, (නව නිවාස පෙදෙස) විද්‍යානවත්ත, කිනියාගොඩ පොල්හේන, එකමගොඩවත්ත ජනපදය, බදුගම වත්ත සහ යන ගම් කොටස් වලින් සමන්විත වේ. |
| | අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය—සිරිකඳුර: බදුගම ගමේ ගල්ලැල්ලහේන, ලියන් කන්ද, ඔව්විගල ගමේ සිරිකඳුර වත්ත, ඇල්ල, බෝදියාකන්ද, කොක්හේන, පුස්වැල් තැන්න, කොහිල දෙනිකන්ද, සහ මතුගම සුළු නගර සභා සීමාවෙන් බැහැර බදුගම ගමේ සිරිකඳුර පාරේ දෙපසේ කොටසින් ආදී ගම් කොටස් වලින් සමන්විත වේ. |
| අංක 795/797—නවුත් තුඩුව/කිරන්තිඩිය ... | අංක 7 දරණ ඡන්ද කොට්ඨාශය—නවුත් තුඩුව දකුණ: දකුණු නවුත් තුඩුව සහ කීරන්තිඩිය ගමේ හිරිවැද්දල යන කොටසින් සමන්විත වේ. |
| | අංක 8 දරණ ඡන්ද කොට්ඨාශය—නවුත් තුඩුව උතුර: උතුරු නවුත් තුඩුව සහ කීරන්තිඩිය ගමේ අළුත්ගම්ගොඩ නම් වූ කොටසින් සහ යටදොල වතුයායෙන් (ක්ලේ ඩිවිෂන් හැර) සමන්විත වේ. |
| | අංක 9 දරණ ඡන්ද කොට්ඨාශය—පුස්ඇලමුල්ල: කීරන්තිඩිය ගමේ පුස්ඇල මුල්ල කොටසින් සමන්විත වේ. |
| | අංක 10 දරණ ඡන්ද කොට්ඨාශය—කීරන්තිඩිය: කීරන්තිඩිය (හිරිවැද්දල, අළුත්ගම්ගොඩ, සහ පුස්ඇලමුල්ල යන කොටස් හැර) ගමින් සමන්විත වේ. |
| අංක 798—කොටගෙදර ... | අංක 11 දරණ ඡන්ද කොට්ඨාශය—කොටගෙදර කොටගෙදර ගමින් සමන්විත වේ. |
| | අංක 12 දරණ ඡන්ද කොට්ඨාශය—කොලහැකඩ; කොලහැකඩ සහ පල්ලේගොඩ යන ගම්වලින් සමන්විත වේ. |
| අංක 802—බෝපිටිය ... | අංක 13 දරණ ඡන්ද කොට්ඨාශය—බෝපිටිය නැගෙනහිර: දන්ගහඅස්වැද්දුම සහ මාපගන් කුඹුර යන කුඹුරුවලින් උතුරු දෙසින් හා පාන්තිය-බෝපිටිය පාරේ නැගෙනහිර දෙසින් පිහිටි (මතුගම සුළු නගර සභා සීමාවෙන් බාහිරව) බෝපිටිය ගමේ කොටසින් සමන්විත වේ. |
| | අංක 14 දරණ ඡන්ද කොට්ඨාශය—බෝපිටිය බටහිර: දන්ගහ අස්වැද්දුම සහ මාපගන් කුඹුර යන කුඹුරුවලින් දකුණු දෙසින් හා පාන්තිය-බෝපිටිය පාරේ බටහිර දෙසින් පිහිටි (මතුගම සුළු නගර සභා සීමාවෙන් බාහිරවූ) බෝපිටිය ගමේ ඉතිරි කොටසින් සමන්විත වේ. |
| අඅංක 802 ඒ—යටදොලවත්ත... | අංක 15 දරණ ඡන්ද කොට්ඨාශය—යටදොලවත්ත නැගෙනහිර: මහ කොස්ගහමුල්ල, තඹරුපිය, සහ කැටගොඩ යන ගම්වලින් සමන්විත වේ. |
| | අංක 16 දරන ඡන්ද කොට්ඨාශය—යටදොල වත්ත උතුර යටදොල වත්ත ගමින් සමන්විත වේ. |
| | අංක 17 දරණ ඡන්ද කොට්ඨාශය—යටදොලවත්ත බටහිර: යටදොල, බෝකනාවත්ත, දියාගල සහ කරම්පැහැර යන ගම්වලින් සමන්විත වේ. |
| අංක 803—නාරවිල ... | අංක 18 දරණ ඡන්ද කොට්ඨාශය—නාරවිල: නාරවිල ගමින් සමන්විත වේ. |
| | අංක 19 දරණ ඡන්ද කොට්ඨාශය—හේනේගම: හේනේගම සහ පරවල යන ගම්වලින් සමන්විත වේ. |
| අංක 804—පාන්තිය ... | අංක 20 දරණ ඡන්ද කොට්ඨාශය—පාන්තිය නැගෙනහිර: මතුගම සුළු නගර සභා සීමාවෙන් බාහිරව පිහිටි පාන්තිය ගමේ බොක්කේගම හා ගල කුඹුර යන කොටස් වලින් සහ වැල්කන්දල යන ගමින් සමන්විත වේ. |
| | අංක 21 දරණ ඡන්ද කොට්ඨාශය—පාන්තිය බටහිර: මතුගම සුළු නගර සභා සීමාවෙන් බාහිරව පිහිටි පාන්තිය ගමේ (බොක්කේගම සහ ගලකුඹුර යන කොටස් හැර) ඉතිරි කොටසින් සමන්විත වේ. |

11-25—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම, මෙම නිවේදනයෙන්—

(1) කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අරණායක ගම් ප්‍රදේශයේ පිහිටි දැනට පවත්නා සමහර ඡන්ද කොට්ඨාශ අනු කොටස් කර බෙදීමට අදාළව 1964 සැප්තැම්බර් 30 දින අංක 14,185 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් සංශෝධිත, 1964 ජූලි 24 දින අංක 14,117 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය එහි වූ තුන්වැනි උපලේඛනය වෙනුවට, මෙහි වූ උපලේඛනය ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කරමි ; තවද,

(2) (1) වෙනි ඡේදයේ සඳහන් විධිවිධාන (අ) ඒවා 1974 වර්ෂයේ පැවැත් වීමට නියමිත ඉහත කී අරණායක ගම් ප්‍රදේශයේ ගම්සභාවට සභිකයින් තෝරා පත් කර ගැනීමේ මහා ඡන්ද විමසීමට අදළ වන තාක් දුරට මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට ක්‍රියාත්මක විය යුතු යයි ද ;

(ආ) ඒවා වෙන යම් කරුණකට අදළ වන තාක් දුරට 1974 ජූලි පළමුවෙනි දින සිට ක්‍රියාත්මක විය යුතු යයිද,

ප්‍රකාශ කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973 ඔක්තෝබර් මස 2 දින,
කොළඹ දී ය .

### උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| අංක 41—අරම ... | අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය—අරම—අරම, දෙයියන්වල, රහල බටහිර යන ගම්වලින් හා බෙරවිල වත්තෙන් සමන්විතය. |
| | අංක 2 දරණ ඡන්ද කොට්ඨාශය—සැලව—සැලව ගමෙන් සමන්විතය. |
| | අංක 3 දරණ ඡන්ද කොට්ඨාශය—රහල නැගෙනහිර—රහල නැගෙනහිර, රන්දිලි ගම හා කලල්පිටිය යන ගම් වලින් සමන්විතය. |
| අංක 42—හකුරුගම්මන ... | අංක 4 දරණ ඡන්ද කොට්ඨාශය—හකුරුගම්මන—හකුරුගම්මන (පල්ලේගම හා උඩගම) බෝවල් ගහ හා අලගල්ල යන ගම්වලින් සමන්විතය. |
| | අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය—තෙල්එක—තෙල්එක නැමැති ගමෙන් සමන්විතය. |
| | අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය—දූල්දෙණිය—දූල්දෙණිය ගමෙන් හා අඹදෙණිය වත්තේ හකුරුගම්මන ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් කොටසින් සමන්විතය. |
| | අංක 7 දරණ ඡන්ද කොට්ඨාශය—පන්නල—පන්නල දෙමළගිරිය හා කිරපොනේ යන ගම් වලින් සමන්විතය. |
| අංක 43—අරණායක ... | අංක 8 දරණ ඡන්ද කොට්ඨාශය—අරණායක—අරණායක (මහ ඔයෙන් නැගෙනහිර කොටස) අරණායක (මහඔයෙන් බටහිර කොටස) උග්ගොඩ යන ගම් වලින් හා ඇලික්ලන්ඩ් වත්තෙන් සමන්විතය. |
| | අංක 9 දරණ ඡන්දකොට්ඨාශය—වැලිමන්න—වැලිමන්න හා ගැටබේරි කන්ද යන ගම් වලින් සමන්විතය. |
| අංක 43 ඒ.—අම්බලකන්ද ... | අංක 10 දරණ ඡන්ද කොට්ඨාශය—අම්බලකන්ද—අම්බලකන්ද ගමෙන් හා නාරංගල වත්ත, මවුන්ට්කාමල් වත්ත ඉහළ කොටස, මවුන්ට්කාමල් වත්ත පහළ කොටස යන වතු වලින් සමන්විතය. |
| | අංක 11 දරණ ඡන්ද කොට්ඨාශය —පෝඩාපේ—පෝඩාපේ ගමෙන් සමන්විතය. |
| අංක 44—තල්ගස්පිටිය ... | අංක 12 දරණ ඡන්ද කොට්ඨාශය —තල්ගස්පිටිය අංක 1—තල්ගස්පිටිය සිංහලගම, යෝදගම, දීවෙල් ගම, මැදිලිය සහ බෝපිටිය යන ගම්වලින් සමන්විතය. |
| | අංක 13 දරණ ඡන්ද කොට්ඨාශය —තල්ගස්පිටිය අංක 2—තල්ගස්පිටිය මරක්කල ගමෙන් හා පනාපුරේ වත්තෙන් සමන්විතය. |
| | අංක 14 දරණ ඡන්ද කොට්ඨාශය — හබලත්තාව—හබලත්තාව, කොට්ටල් බද්ද දූල්දෙනිය, බකුල්වල, තැඹරව හා අඹකුඹුර යන ගම්වලින් සමන්විතය. |
| අංක 45—දිප්පිටිය ... | අංක 15 දරණ ඡන්ද කොට්ඨාශය — විල්පොල—විල්පොල, දිඹුල්ගමුව, ඉද්දවල, මාඩතගොඩ, යන ගම් වලින් හා අරණායක ජනපදයේ දිප්පිටිය ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් කොටසින් සමන්විතය. |
| | අංක 16 දරණ ඡන්ද කොට්ඨාශය — දිප්පිටිය—දිප්පිටිය නගරය, දිප්පිටිය ගම, බුදවත්ත, ගැරුපත්ගම, මේනම හා තවලන්ගොඩ යන ගම් වලින් සමන්විතය. |
| අංක 45ඒ.—ගැවිලිපිටිය ... | අංක 17 දරණ ඡන්ද කොට්ඨාශය — ගැවිලිපිටිය—ගැවිලිපිටිය නගරය, ගැවිලිපිටිය ගම හා අඹදෙනිය වත්තේ ගැවිලිපිටිය ග්‍රාමසේවක කොටසට අයත් කොටසින් සමන්විතය. |
| | අංක 18 දරණ ඡන්ද කොට්ඨාශය — පැහිණිපැද්දර—පැහිණිපැද්දර නැමැති ගමෙන් සමන්විතය. |
| අංක 46—නිකපිටිය ... | අංක 19 දරණ ඡන්ද කොට්ඨාශය — නිකපිටිය—නිකපිටිය, පොල්අඹේගොඩ යන ගම් වලින් හා පොල්දෙනිය ජනපදයෙන් සමන්විතය. |
| | අංක 20 දරණ ඡන්ද කොට්ඨාශය — ගොඩිගමුව—ගොඩිගමුව නමැති ගමෙන් සමන්විතය. |
| | අංක 21 දරණ ඡන්ද කොට්ඨාශය — නාරංගම්මන—නාරංගම්මන, කාල්වාන හා බුළුගම්මන යන ගම් වලින් සමන්විතය. |
| අංක 47—හත්ගම්පොල ... | අංක 22 දරණ ඡන්ද කොට්ඨාශය — එළහපිටිය—එළහපිටිය ගමෙන්ද, අරණායක ජනපදයේ හත්ගම්පොල ග්‍රාම සේවක කොටසට අයත් කොටසින් හා යෙලන්ගවරි වත්තෙන් සමන්විතය. |
| | අංක 23 දරණ ඡන්ද කොට්ඨාශය — මෝරාගම්මන—මෝරාගම්මන හා ගැටබේරිය යන ගම් වලින් සමන්විතය. |
| | අංක 24 දරණ ඡන්ද කොට්ඨාශය — හත්ගම්පොළ—හත්ගම්පොළ නැමැති ගමෙන් සමන්විතය. |
| | අංක 25 දරණ ඡන්ද කොට්ඨාශය — පරපිටිය—පරපිටිය, බෙලිගොඩ හා වියන්එළිය යන ගම් වලින් සමන්විතය. |
| අංක 47ඒ.—දෙබත්ගම ... | අංක 26 දරණ ඡන්ද කොට්ඨාශය — දෙබත්ගම උඩබාගේ—දෙබත්ගම උඩබාගේ නැමැති ගමෙන් සමන්විතය. |
| | අංක 27 දරණ ඡන්ද කොට්ඨාශය — දෙබත්ගම පල්ලෙබාගේ—දෙබත්ගම පල්ලේබාගේ නැමැති ගමෙන් සමන්විතය. |
| | අංක 28 දරණ ඡන්ද කොට්ඨාශය — කලුගල—කලුගල ජනපදය හා දෙබත්ගම ජනපදයෙන්ද දෙබත්ගම වතුයායෙන් හා ඌරාකන්ද වත්තෙන් ද, සමන්විතය. |

11-61—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

## මොරටුව නගර සභාව

### විනෝද බදු ආඥපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මොරටුව නගර සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව, ඒ වගන්තියේ (2) උප වගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

#### යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මෙම සභාව විසින්, සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥපනතෙහි විස්තර කොට ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අය කරනු ලබන ගාස්තුවලින් 1952 ජූනි මස 27 වැනි දින අංක 10,418 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මුතියෙන් එබඳු ගෙවීම් සඳහා පනවා අය කරනලද බද්ද වෙනුවට මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව වූ බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළවන දින සිට, මෙසින් පනවා අය කරනු ලැබේ.

#### ගෙවන මුදල

| බදු ප්‍රමාණය හැර ඇතුළුවීමේ ගාස්තුව | බදු ප්‍රමාණය රු. ශ. |
|---|---|
| (1) ශත 20 ට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... | 05 |
| (2) ශත 50 ට වැඩිවන නමුත් ශත 99 ට වැඩි නොවන විට ... ... | 10 |
| (3) රු. 1.00 වන විට ... ... | 20 |
| (4) රු. 1.00 ට වැඩිවන නමුත් රු. 1.50 වැඩි නොවන විට ... ... ... | 25 |
| (5) රු. 1.50 ට වැඩිවන නමුත් රු. 2.00 වැඩි නොවන විට ... ... ... | 35 |
| (6) රු. 2.00 ට වැඩි වන නමුත් රු. 3.00 වැඩි නොවන විට ... ... ... | 50 |
| (7) රු. 3.00 ට වැඩිවන නමුත් රු. 4.00 වැඩි නොවන විට ... ... ... | 75 |
| (8) රු. 4.00 ට වැඩිවන නමුත් රු. 5.00 වැඩි නොවන විට ... ... ... | 1 0 |
| (9) රු. 5.00 ට වැඩිවන විට— | |
| (1) පළමුවන රු. 5.00 ට ... ... | 1 0 |
| (2) එක් එක් අතිරේක රු. 1.00 ට හෝ ඉන් කොටසකට ... ... | 25 |

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ඔක්තෝබර් 5 දින,
කොළඹ දීය.

11-5—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## වැල්ලවාය ගම්සභාව

### විනෝද බදු ආඥපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ වැල්ලවාය ගම්සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව එම වගන්තියේ (2) වැනි උපවගන්තියේ ප්‍රකාර මෙයින් පළ කරනු ලැබේ.

#### යෝජනාව

"(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මේ සභාව විසින් සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (එම ආඥපනතෙහි විස්තර කර ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන සියළුම ගෙවීම් වලින් සියයට විස්සක බද්දක්, 1956. 09. 28 වැනි දින අංක 10,976 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මුති යෝජනාව මගින් එවැනි ගෙවීම් වෙනුවෙන් පනවා අයකරන ලද බද්ද වෙනුවට මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට මෙසින් පනවා අයකරනු ලැබේ."

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ඔක්තෝබර් 16 වැනි දින,
කොළඹ දීය.

11-19—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## පල්ලේ ගම්පහ කෝරළේ ගම්සභාව

### විනෝද බදු ආඥපනත

(267 වැනි අධිකාර වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පල්ලේ ගම්පහ කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරනු ලැබ, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද පහත සඳහන් යෝජනාව, ඒ වගන්තියේ (2) වන උප වගන්තිය අනුව පළ කරනු ලැබේ.

#### යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මේ සභාව විසින්, එහි පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥපනතේ විස්තර කොට ඇති) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අය කරනු ලබන ගාස්තුවලින් මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව වූ බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළවන දින සිට මෙයින් පනවා අයකරනු ලැබේ.

#### ගෙවන මුදල

| බදු ප්‍රමාණය හැර ප්‍රවේශ ගාස්තු | බදු ප්‍රමාණය රු. | ශ. |
|---|---|---|
| (අ) ශත 20 ට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... ... | 0 | 05 |
| (ආ) ශත 50 ට වැඩි නමුත් රු. 1 ට වැඩි නොවන විට ... | 0 | 10 |
| (ඇ) රු. 1 ට වැඩි නමුත් රු. 1.50 ට වැඩි නොවන විට ... | 0 | 15 |
| (ඈ) රු. 1.50 ට වැඩි නමුත් රු. 2 ට වැඩි නොවන විට ... | 0 | 20 |
| (ඉ) රු. 2. ට වැඩි නමුත් රු. 3. ට වැඩි නොවන විට ... | 0 | 30 |
| (ඊ) රු. 3. ට වැඩි නමුත් රු. 4. ට වැඩි නොවන විට ... | 0 | 40 |
| (උ) රු.4 ට වැඩි නමුත් රු. 5 ට වැඩි නොවන විට ... | 0 | 50 |
| (ඌ) රු. 5 ට වැඩි නමුත් රු. 10 ට වැඩි නොවන විට ... | 1 | 0 |
| (එ) රු. 10 ට වැඩිවන විට— | | |
| (i) පළමු රු. 10 ට ... ... | 1 | 0 |
| (ii) එක් එක් අතිරේක රු. 5 කට හෝ ඉන් කොටසකට ... ... ... | 1 | 0 |

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ඔක්තෝබර් මස 17 දින,
කොළඹ දීය.

11-20—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

**ගම්සභා ආඥපනත**

ගම් සභා ආඥපනතේ 17 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ ගම්සභා ආඥපනතේ (257 වැනි අධිකාරය) 17 (5) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර යාපනය දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් කනකනායගම් නල්ලයිනාදන් වන මා විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ I වන තීරුවේ සඳහන් ගම්සභාවේ සභා රැස්වීම II වන තීරුවේ සඳහන් දිනයේදී III වන තීරුවේ සඳහන් වේලාවේදී IV වන තීරුවේ සඳහන් ස්ථානයේදී කැඳවා සිටිනු ලැබේ.

කේ. නල්ලයිනා දන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්, යාපනය.

1973 ඔක්තෝබර් මස 13 වැනි දින,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
යාපනය.

**උපලේඛනය**

| I වැනි තීරුව ගම්සභාවේ නම | II වැනි තීරුව දිනය | III වැනි තීරුව වේලාව | IV වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| කාරෙයිනගර්-උතුරු ... ... ... | 1973.11.09 ... | 9.00—උදය ... | කාරෙයිනගර්-උතුරු ගම්සභා කාර්යාලය |

11–119—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥපනත**

13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ගම්සභා ආඥපනතේ (257 වැනි අධිකාරය) 13(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ශ්‍රී නාරායන බ්‍රාහ්මණ වඩිනාමුන මුදියන්සේලාගේ මන්ත්‍රීපාල වන මම අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවල කෝරළේ අංක 2 දරණ කොට්ඨාශයේ සභික සරනපාල දිසානායක මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත් කර ගැනීමෙන් පසු, නොපැමිණි බව ගැන සෑහීමට පත්ව අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවල කෝරළේ ගම්සභාවේ අංක 2 දරණ කොට්ඨාශයේ සභික සරනපාල දිසානායක මහතා මෙම දැන්වීම් ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට තම සභික ධුරය අත් හරිනු ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එන්. බී. ඩබ්. ඇම්. මන්ත්‍රීපාල,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
අනුරාධපුර දිස්ත්‍රික්කය.

1973 සැප්. මස 13 දින,
අනුරාධපුර,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දීය.

11–46—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

# තනතුරු – ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත් කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවය භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදළ නිලධාරිතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහිද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරු වලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදළ නොවනු ඇත. එහෙත්, ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජූනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට 3 ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කල හැකිය.

(ඊ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(උ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(ඌ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(එ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුය.

4. **පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදල පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දනට පවත්නා වූත් හෝ මින්මතු සම්පාදනය කළ හැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලටත් එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරී කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වනතුරු නියමිත වැටුප් වැඩිවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අවම සුදුසුකම් වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාල නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය තනතුරු ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලැබේ.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට ඔවුන්ගේ නිත්‍ය භට හමුදු සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අවම අධ්‍යාපන සුදුසුකම්, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානියන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම් කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදවන්නට තමන් සූදානමව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු
අයදුම් පත් ආකෘතිය

පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

——————— තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :———.
(ආ) අල්ලුම්කර සිටින තනතුර :———.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :———.
ජාතිය :———.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :———.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :———, මාස :———, දින :———.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ලංකාවේ නුපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ආ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තිය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම :————,

10. වෘත්තිය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, [illegible], සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදර වලින් නිදහස්ද එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක්ද? : ————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) : ————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ.පෙ. 530, කොළඹ 1.

### පළාත් පාලන සේවය

ගෘහ නිර්මාණ ශිල්පී තනතුර—නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. තෝරාගනු ලැබෙන අපේක්ෂකයා පළමු වරට කොළඹ නගර සභාවට පත් කරනු ලැබේ.

**2. වැටුප් පරිමාණය.**—මෙම තනතුරට අදාළ වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය රු. 7,800—3×360—රු. 8,880/9,600—4×360—11×480—රු. 16,320 කි. මෙම වැටුප් පරිමාණයෙහි වසරකට රු. 9,600 සහ රු. 14,400 ට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් වෙති. සුදුසුකම් හා පළපුරුද්ද අනුව, සුදුසු අපේක්ෂකයෙකු මෙම වැටුප් පරිමාණයෙහි පියවරක තැබීමට පිළිවන.

රජයේ නිලධාරීන්ට අදාළ කොන්දේසි හා ප්‍රමාණයන් අනුව විවාහක දීමනාවක් ද, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

**3. අවශ්‍ය සුදුසුකම් :**

(අ) වයස.—1973. 12. 3 දිනට වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන්ට, බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ සංගමික සාමාජිකත්වයක් හෝ ඊට සමාන හෝ සුදුසුකම් තිබිය යුතුයි.

4. මෙම ගැසට් පත්‍රයේ IV වන කොටසේ ආරම්භයෙහි පළකර ඇති පළාත් පාලන සේවයෙහි තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි බලනු මැනවි.

5. පත්වීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1973. 12. 3 දිනට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

6. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස් හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර භාර දී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණී.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 22 වෙනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

11–101—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන සේවය

සිවිල් ඉංජිනේරු තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත් කැඳවයි.

**2. ඒකාබද්ධ වැටුප් පරිමාණය.**—රු. 9,600, රු. 14,400 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩඉම්ද සහිත රු. 7,800—3×360—රු. 8,800, රු. 9,600—4×360—11×480—රු. 16,320 වේ.

මෙයට අමතරව රජයේ නිලධාරීන්ට අදාල ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

**සටහන :—**

(i) සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් (එනම්, ලන්ඩන් සිවිල් ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය හෝ එයට සමාන ලෙස පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් සලකන සුදුසුකම්) නොමැති අය, ඉහත සඳහන් වැටුප් පරිමාණයේ රු. 13,440 යන වාර්ෂික වැටුප් ඉක්මවා වැටුප් ලැබීමට සුදුසු නොවේ.

(ii) සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ඇති අයගේ වැටුප රු. 9,960 ක වාර්ෂික වැටුපකින් ආරම්භ වේ.

(iii) අයදුම්කරුවෙකු පත් කරනු ලැබූ විට ඔහුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් පරිමාණයෙහි කිසියම් පියවරක තබනු ලැබිය හැකිය.

(iv) රු. 9,600 ක් වන වාර්ෂික වැටුපට පළමුව ඇති කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට යෑම සඳහා නිලධාරීහු පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද පරිදි දෙපාර්තමේන්තු කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ යුත්තාහ.

**3. අවශ්‍ය සුදුසුකම් :—**

(අ) වයස :— 1973. 12. 03 දිනට වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

(ආ) අයදුම්කරුවන්ට පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ බී. එස්. සී. (ඉංජිනේරු විද්‍යාව) උපාධිය තිබිය යුතුය. නැතහොත්, ඔවුන් නාගරික ඉංජිනේරුවන්ගේ ආයතනයේ I හා II වන කොටස්වලින් හෝ එම්. අයි. සී. ඊ. I හා II වන කොටස්වලින් සමත් වී තිබිය යුතුය. එසේ නැතහොත් ඊට ඉහළ සුදුසුකම් තිබිය යුතුය.

සටහන :—බී. එස්. සී. (ඉංජිනේරු) අවසාන විභාගයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින්නා වූ අයටද අයදුම් කළ හැකිය. කෙසේ වුවද විභාගයෙන් සමත් වුවහොත් පමණක් ඔවුන් පත්වීම් සඳහා සළකා බලනු ලැබේ.

4. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සම්පාදිත අයදුම්පත් 1973. 12. 03 වැනි දිනට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

6. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, එම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 23 දින,
තැ. පෙ. 530— කොළඹ.

11–171—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## අතුරු ව්‍යවස්ථා

ඇල්.ජී.—බී. 52/52.

### මීගමුව මහ නගර සභාව

මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 හා 272 යන වගන්ති යටතේ මීගමුව මහ නගර සභාව විසින් සාදනු ලැබ, එම ආඥාපනතේ 268 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ හා ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා.

සී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ඔක්තෝබර් මස 3 වන දින,
කොළඹ දීය.

## අතුරු ව්‍යවස්ථා

1. මස්, මාළු, පළතුරු හෝ එළවලු කිසිවක් විකිණීම, පොදු වෙළඳ පොළක් හෝ තවත් නිසි පරිදි බලපත්‍ර ලත් පෞද්ගලික වෙළඳ පොළක් හෝ ඒ කාර්යය සඳහා සභාව විසින් බලය දෙනු ලැබූ යම් ස්ථානයක් නොවන කිසිම ස්ථානයකදී කරනු නොලැබිය යුතු ය.

2. සභාව විසින් අනුමත කරන ලද යම් ස්ථානයක, අලුත් මාළු නොවන මාළු හෝ මුදවන ලද මස් හෝ ශීත කරන ලද මස්, බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කොන්දේසි යටතේ විකිණීම සඳහා වූ බලපත්‍රයක්, එක් එක් අවුරුද්ද සඳහා රුපියල් පහක ගාස්තුවක් ගෙවනු ලැබීමෙන් පසු එම ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට සභාව විසින් නිකුත් කරනු ලැබිය හැකිය.

3. පළතුරු හෝ එළවලු හෝ අලුත් මාළු විකුණන සංචාරක වෙළෙන්දකු තම වෙළඳාම නියම් කරගත් ස්ථානවල නොකරන තාක් හෝ තම වෙළඳාම කරන ස්ථානය යම් පොදු වීථියක හෝ යම් පොදු ස්ථානයක පිහිටුවා නොගන්නා තාක් ඒ වෙළෙන්දාට මේ අතුරු ව්‍යවස්ථාවල ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් පිළිබඳ ව වූ සෑම උල්ලංඝනය කිරීමකටම රුපියල් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි අතර ඒ උල්ලංඝනය කිරීම නොනවත්වා කරගෙන යන අවස්ථාවකදී නම්, වරදකරු කරනු ලැබීමෙන් හෝ ඒ උල්ලංඝනය කිරීම ගැන අවධානය යොමු කරවමින් ලිඛිත දැන්වීමක් නගරාධිපති විසින් භාරදෙනු ලැබීමෙන් පසු ඒ උල්ලංඝනය කිරීම දිගටම කරගෙන යනු ලබන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් විසිපහකට නොවැඩි අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකිය.

5. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාව" යන්නෙන් මීගමුව මහ නගර සභාව අදහස් වේ;
"නගරාධිපති" යන්නෙන් සභාවේ නගරාධිපති අදහස් වේ;
"මස්" යන්නෙන් යම් හරකකුගේ, බැටළුවකුගේ, එළුවකුගේ හෝ ඌරකුගේ මාංශය අදහස් වේ.

6. මීගමුව පළාත් ආණ්ඩු සභාව විසින් සාදනු ලැබ, 1933 අගෝස්තු මස 4 වැනි දින අංක 1,995 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා මෙයින් ඉවත් කරනු ලැබේ.

11-22—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## යාපනය මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 සහ 272 වැනි වගන්ති යටතේ යාපනය මහ නගර සභාව විසින් සම්පාදිතව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් එකී ආඥාපනතේ 268 වැනි වගන්තිය යටතේ අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

1973 අගෝස්තු මස 17 වන දින,
කොළඹ දිය.

## අතුරු ව්‍යවස්ථාව

යාපනය මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත ඉල්ලුම් කරණු ලැබුව හොත් යම්කිසි කර්මාන්තයක් කරගෙන යනු ලබන ස්ථානයක ඉවතලන සුන්බුන් වරින්වර නාගරික කොමසාරිස් විසින් නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් අනුව මහ නගර සභාව විසින් ඉවත් කරනු ලැබේ.

11-23—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## හපුතලේ නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 හා 157 වැනි වගන්ති යටතේ හපුතලේ නගර සභාව විසින් සාදනු ලැබ, එකී ආඥා පනතේ 154 වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක
ලේකම්

1973 ඔක්තෝබර් මස 17 වන දින,
කොළඹ දීය.

## අතුරු ව්‍යවස්ථාව

1948 මැයි මස 14 වැනි දින අංක 9,863 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ වරින් වර සංශෝධිත හපුතලේ වෙළඳපොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථා ඊට යාකොට ඇති "ආ" සහ "ඇ" උපලේඛන වෙනුවට පහත සඳහන් අළුත් උපලේඛන ආදේශ කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

### "ආ" උපලේඛනය

| අවසර පත්‍රය | බද්ද හෝ ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| 1. ස්ථිර කඩ කාමරයක් සඳහා මසකට ... ... | 15 | 0 |
| 2. වෙළඳ පොළේ පහත ඹිම් මාලයේ හපුතලේ බදුල්ල පාරට මුහුණ ලා ඇති ස්ථිර කඩ කාමරයක් සඳහා මසකට ... ... ... | 30 | 0 |
| 3. දිනක හෝ ඉන් අඩු ප්‍රමාණයක් වෙනුවෙන් ස්ථිර කඩ කාමරයක් සඳහා ... ... | 1 | 0 |
| 4. දෙසතියක හෝ ඉන් අඩු කාලයකට තාවකාලික කඩ කාමරයක් සඳහා ... ... | 2 | 50 |
| 5. වෙළඳපොළේ එළිමහන් බිමේ වර්ග අඩි 3 ක් හෝ ඉන් කොටසක් සඳහා දිනකට ... ... | 0 | 15 |

### "ඇ" උපලේඛනය

දඹේතැන්න පාරේ වෙළඳ පොළේ අර්ධ ස්ථිර ගොඩනැගිලි.

| අවසර පත්‍රය | මසකට බද්ද හෝ ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 1 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 2 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 3 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 4 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 5 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 6 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 7 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 8 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 9 ... | 20 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 10 ... | 20 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 11 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 12 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 13 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 14 ... | 15 | 0 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි අංක 15 ... | 15 | 0 |

11-21—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

මහරගම උප නගර සභාව

මුදල් රෙගුලාසි අංක 40(ii) යටතේ අයදුම් පත—1973 අය-වැය ලේඛනය

මෙහි පහත සඳහන් ශීර්ෂ යටතේ ඉතිරි වී ඇති මුදල ඒ සමග දක්වෙන ශීර්ෂයට මාරු කොට වැය කිරීමට 1973 සැප්තැම්බර් මස 28 වැනි දින පැවැති රැස්වීමේ අංක 27 දරණ යෝජනාව යටතේ සභා සම්මත විය.

1 වැනි කොටස—සාමාන්‍ය අංශය

| ශේෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(2) (ඇල්) නිල ඇඳුම් ... ... | 350 | 0 |
| ඒ.—(2) (ඇම්) අතිකාල දීමනා ... ... | 2,000 | 0 |
| බී.—(7) අත්පත් කරගැනීම් ... ... | 1,240 | 0 |
| ඩී.—(1) (ජේ) සෞඛ්‍ය සතිය සඳහා වියදම් ... | 150 | 0 |
| ඩී.—(1) (කේ) කිරි පරීක්ෂා කිරීමට ... ... | 500 | 0 |
| ඩී.—(1) (ඇල්) පිස්සු බලු උවදුර ... ... | 500 | 0 |
| ඩී.—(1) (ඇම්) බරවා රෝග මර්දන සඳහා ... | 500 | 0 |
| ඩී.—(2) (සී) ගබඩා බඩු ... ... ... | 400 | 0 |
| ඩී.—(3) (ඒ) වේතන ... ... ... | 4,500 | 0 |
| ජී.—(1) බල්ලන් විනාශ කිරීම ... ... | 500 | 0 |
| එකතුව ... | 10,640 | 0 |

| අතිරික්ත | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඒ) ලේකම් ... ... ... | 900 | 0 |
| ඒ.—(1) (බී) ලිපිකරුවන් ... ... | 1,500 | 0 |
| ඒ.—(1) (සී) ආදායම් පරීක්ෂක ... ... | 400 | 0 |
| ඒ.—(2) (ඒ) දීමනා ... ... ... | 100 | 0 |
| ඒ.—(2) (බී) ගමන් වියදම් ... ... | 1,200 | 0 |
| ඒ.—(2) (සී) අයබදු අයකරන්නන්ට කොමිස් ... | 1,500 | 0 |
| ඒ.—(2) (ඊ) නීතිඥ ගාස්තු ... ... | 1,500 | 0 |
| බී.—(1) (බී) කර්මාන්ත ඕවර්සියර් ... ... | 50 | 0 |
| සී.—(1) වේතන ... ... ... | 600 | 0 |
| ඩී.—(1) (ඒ) වේතන ... ... ... | 540 | 0 |
| ඩී.—(1) (ජී) උපකරණ හා බෙහෙත් ... ... | 50 | 0 |
| ඩී.—(1) (එච්) කාණු ඉදිකිරීමට ... ... | 700 | 0 |
| ඩී.—(2) (බී) කරත්ත 1 ගවයින් හා ලොරි ... | 1,500 | 0 |
| ඩී.—(6) (ඒ) වේතන ... ... ... | 100 | 0 |
| එකතුව ... | 10,640 | 0 |

2 වැනි කොටස—විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| විදු.—(4) (ඒ) වැටුප් ... ... ... | 1,000 | 0 |
| විදු.—(4) (සී) අතිකාල දීමනා ... ... | 500 | 0 |
| විදු.—(5) (ඒ) ගොඩනැගිලි ... ... | 7,300 | 0 |
| විදු.—(6) (බී) (1) තාවකාලික (කම්කරු ගාස්තු) ... | 2,000 | 0 |
| එකතුව ... | 10,800 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| විදු.—(3) (ඊ) ගමන් වියදම් ගාස්තු ... ... | 400 | 0 |
| විදු.—(3) (ජේ) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ගාස්තු, ප්‍රචාරක දැන්වීම් හා කාර්‍යාලයේ වෙනත් වියදම් ... ... | 500 | 0 |
| විදු.—(3) (කේ) බැංකු ගාස්තු ... ... | 800 | 0 |
| විදු.—(3) (ඕ) රක්ෂණ ගාස්තු ... ... | 100 | 0 |
| විදු.—(5) (සී) වාහන ... ... ... | 5,000 | 0 |
| විදු.—(6) (ඒ) (11) නඩත්තු කිරීම සඳහා ... ... | 4,000 | 0 |
| එකතුව ... | 10,800 | 0 |

ඊ. ඩී. චන්ද්‍රසේකර,
සභාපති,
මහරගම උප නගර සභාව.

1973 ඔක්තෝබර් මස 16 වැනි දින,
මහරගම උප නගර සභා කාර්‍යාලයේ දීය.

11–6—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

හාලිඇල සුළු නගර සභාව

පළමුවැනි පරිපූරක අයවැය ලේඛනය—1973 (සාමාන්‍ය)

| | රු. | ශ. |
|---|---|---|
| ඒ. 2 එච්. ගණකාධිකාරි ගාස්තු ... ... | 961 | 11 |

පූර්වෝක්ත වැය ශීර්ෂය 73. 09. 28 වැනි දින අංක 7 දරණ යෝජනාවෙන් සභාසම්මත කරන ලදී.

දි. ර. ආ. ප්‍රේමදාස,
හාලිඇල සුළු නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 20 වැනි දින,
හාලිඇල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

11–105/1—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

හාලිඇල සුළු නගර සභාව

පළමුවැනි පරිපූරක අයවැය ලේඛනය—1973 (විදුලි)

| | රු. | ශ. |
|---|---|---|
| 4. ඒ. වැටුප් හා වේතන ... ... | 300 | 0 |

පූර්වෝක්ත වැය ශීර්ෂය 73. 09. 28 වැනි දින අංක 7 දරණ යෝජනාවෙන් සභාසම්මත කරන ලදී.

දි. ර. ආ. ප්‍රේමදාස,
හාලිඇල සුළු නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 20 වැනි දින,
හාලිඇල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

11–105/2—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

දළුගම සුළු නගර සභාව

1973 වර්ෂයේ පළමුවැනි පරිපූරක අය-වැය ලේඛනය—විදුලිය

මු.රෙ. 40(1) යටතේ I වන කොටස—පුනරාවර්තන වියදම්

| වැය සිරස | | මුදල රු. | ශ. |
|---|---|---|---|
| (3) පාලනය සහ සාමාන්‍ය වියදම් : | | | |
| (එච්) විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදල් සහ අර්ථසාධක අරමුදලට දයක මුදල් | ... | 1,000 | 0 |
| | | 1,000 | 0 |

මගේ 1973 අගෝස්තු මස 01 වැනි දින අංක 4 දරණ තීරණය අනුව සකස් කොට සම්මත කරන ලදී.

ඒ. ඇස්. ද සිල්වා,
පරිපාලන නිලධාරි,
දළුගම සුළු නගර සභාව.

1973 අගෝස්තු මස 02 වැනි දින,
දළුගම සුළු නගර සභා කායාීලයේ දිය,
මහර, කඩවත.

11-80/1—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

දළුගම සුළු නගර සභාව

සුළු නගර සභා මුදල් රෙගුලාසි 40(II) යටතේ ඉල්ලුම් පත්‍රය

1973 අය-වැය ලේඛනය

1973 අය-වැය ලේඛනයේ මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන්, වැය ඉක්මවායයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ට, මෙහි පහත සඳහන් පරිදි, මුදල් මාරුකිරීමට 1973 අගෝස්තු මස 29 වැනි දින අංක 2 දරණ තීරණයෙන් සම්මත කරමි.

මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති ශීර්ෂ හා මුදල

| | රු. | ශ. |
|---|---|---|
| ඊ.—(4) අයත්කර ගැනීම ... ... | 8,620 | 0 |
| එෆ්.—(6) අයත්කර ගැනීම ... ... | 5,000 | 0 |
| ජේ.—(8) ඉදිකිරීම් ... ... ... | 15,000 | 0 |
| එකතුව ... | 28,620 | 0 |

වැය ඉක්මවායයි ගණන් බලා ඇති ශීර්ෂ හා මුදල

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඒ) (1) පළාත් පාලන නිලධාරි ... ... | 4,000 | 0 |
| ඒ.—(1) (ඇෆ්) විශ්‍රාම වැටුප් ... ... | 1,500 | 0 |
| ඒ.—(2) (කේ) කායාීලයට දව බඩු සහ උපකරණ ... | 3,000 | 0 |
| බී.—(2) නඩත්තු කිරීම ... ... ... | 3,035 | 0 |
| බී.—(8) දියුණු කිරීම ... ... ... | 9,960 | 0 |
| සී.—(4) නඩත්තු කිරීම ... ... ... | 1,025 | 0 |
| ඩී.—(1) (ඇෆ්) විෂබීජ නාශක ද්‍රව්‍ය ... ... | 4,000 | 0 |
| ඩී.—(1) (එච්) කාණු ඉදිකිරීම ... ... | 2,100 | 0 |
| එකතුව ... | 28,620 | 0 |

ඒ. ඇස්. ද සිල්වා,
පරිපාලක නිලධාරි,
දළුගම සුළු නගර සභාව.

1973 අගෝස්තු මස 30 වැනි දින,
දළුගම සුළු නගර සභා කායාීලයේ දිය,
මහර, කඩවත.

11-80/2—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

හොරණ නගර සභාව

අතිරේක වැය ලේඛනය—අංක 2 (1973 අය-වැය ලේඛනය)

සාමාන්‍ය අංශය

1973 සැප්තැම්බර මස 01 වැනි දින පවත්වන්නට යෙදුන හොරණ නගර සභා මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5 (5) දරණ සම්මුතියෙන් පහත දැක්වෙන අතිරේක වැය ශීර්ෂ සභා සම්මත විය.

| | රු. | ශ. |
|---|---|---|
| බී.—(2) පොදු මංමාවත් නඩත්තුව ... ... | 2,920 | 0 |
| යෝ. 5(4)—බී.—(2) පොදු මංමාවත් නඩත්තුව ... ... | 3,500 | 0 |
| යෝ. 5(5)—බී.—(2) පොදු මංමාවත් නඩත්තුව ... ... | 3,800 | 0 |
| එකතුව ... | 10,220 | 0 |

ඩබ්ලිව්. ඇම් පොන්සේකා,
සභාපති,
හොරණ නගර සභාව.

1973 සැප්තැම්බර් 01 දින,
හොරණ,නගරසභා කාර්යාලයේ දිය.

11-24/1—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

### හොරණ නගර සභාව

මුදල් රෙගුලාසි අංක 12(II) යටතේ කෙරෙන අයදුම—අංක 2

සාමාන්‍ය අංශය

1973 ඔක්තෝබර මස 06 වැනි දින පවත්වන්ව යෙදුන හොරණ නගර සභා මාසික සභා රැස්වීමේදී පහත දැක්වෙන පරිදි 1973 වර්ෂයේ අය-වැය ලේඛනයේ ඉතිරිවේයැයි ගණන් බලා ඇති පරිදි ඒ ඒ වැය ශීර්ෂ ශේෂයන් අවශ්‍ය වැය ශීර්ෂයන්ට මාරු කිරීමට යෝජනා අංක 5(2) දරණ සම්මුතියෙන් සභා සම්මත විය.

| අතිරික්තය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඒ) වැටුප්—ලේකම් ... ... | 1,860 | 0 |
| ඒ.—(1) (බී) වැටුප්—ලිපිකරු, ආ. ප. ... ... | 4,500 | 0 |
| ඒ.—(2) (ඒ) අමතර දීමනා ... ... | 230 | 0 |
| ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 1,000 | 0 |
| ඒ.—(2) (එෆ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණාදිය ... ... | 2,330 | 0 |
| ඒ.—(2) (ජේ) නිවාඩු දුම්රිය බලපත් ... ... | 500 | 0 |
| ඒ.—(2) (කේ) ජීවනාධාර (විශ්‍රාමික) ... ... | 1,300 | 0 |
| සී.—(1) තානායම්—වැටුප් ... ... | 580 | 0 |
| ඊ.—(1) (ඇම්) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ... | 500 | 0 |
| ඊ.—(2) (බී) කරත්ත/ගොනුන්/ලොරි ... ... | 500 | 0 |
| ඊ.—(3) (බී) කරත්ත/ගොනුන්/ලොරි ... ... | 200 | 0 |
| ඩී.—(8) අලුත් වැඩ ... ... ... | 2,500 | 0 |
| එකතුව ... | 16,000 | 0 |

| ශේෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(2) (ඇම්) නිල ඇඳුම් ... ... | 500 | 0 |
| බී.—(1) (ඒ) වැඩ පරිපාලක—වැටුප් ... ... | 500 | 0 |
| බී.—(1) (සී) කම්කරු—වැටුප් ... ... | 1,200 | 0 |
| සී.—(2) තානායම්—නඩත්තු ... ... | 500 | 0 |
| සී.—(3) තානායම්—ගෘහ භාණ්ඩ ... ... | 750 | 0 |
| සී.—(5) තානායම්—ටෙලිෆෝන් ගාස්තු ... ... | 1,000 | 0 |
| ඩී.—(1) ඉඩම්/ගොඩනැගිලි—වැටුප් ... ... | 100 | 0 |
| ඊ.—(1) (සී) නිල ඇඳුම් ... ... ... | 500 | 0 |
| ඊ.—(2) (ඒ) කුණු කසළ බැහැරලීම—වැටුප් ... | 1,200 | 0 |
| ඊ.—(2) (සී) කුණු කසළ බැහැරලීම—ගබඩාබඩු ... | 500 | 0 |
| ඊ.—(3) (ඒ) වැසිකිළි ශුද්ධ කිරීම—වැටුප් ... ... | 4,000 | 0 |
| ඊ.—(3) (ඊ) වැසිකිළි නඩත්තුව ... ... | 500 | 0 |
| ඊ.—(3) (එෆ්) වැසිකිළි නඩත්තුව—ඉඩම් ලබාගැනීම ... | 1,500 | 0 |
| ඊ.—(3) (ජී) වැසිකිළි නඩත්තුව—ගොඩනැගිලි තැනීම ... | 1,000 | 0 |
| ඊ.—(5) (බී) ජල සම්පාදනය ... ... | 800 | 0 |
| ඊ.—(6) (ඒ) ආරෝග්‍යශාලා පඩිනඩි ... ... | 500 | 0 |
| ඊ.—(7) (ඒ) වෙළඳපොලවල්—පඩිනඩි ... ... | 250 | 0 |
| ජී.—(2) සොහොන් බිම්—නඩත්තුව ... ... | 500 | 0 |
| ඇම්.—(1) කියවීම් ශාලා/පුස්තකාල වැටුප් ... ... | 200 | 0 |
| එකතුව ... | 16,000 | 0 |

ඩබ්ලිව්. ඇම්. පොන්සේකා,
සභාපති,
හොරණ නගර සභාව.

1973 ඔක්තෝබර් මස 16 වැනි දින,
හොරණ නගර සභා කාර්යාලයේ දීය.

11–24/2—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### පිළියන්දල උප නගර සභාව

සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40(II) යටතේ අයදුම් පත්‍රය

අය-වැය ලේඛනය—1973

1973 අය-වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරිවේයැයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරුකර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1973 සැප්තැම්බර් මස 29 වෙනි දින පවත්වන ලද පිළියන්දල උප නගර සභාවේ විශේෂ සභා රැස්වීමේ අංක 4 දරණ යෝජනාවෙන් සභා සම්මතවූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

I වන කොටස

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඒ) ලේකම් ... ... ... | 2,300 | 0 |
| ඒ.—(1) (ඩී) පියන්වරු ... ... | 1,200 | 0 |
| ඒ.—(1) (අයි) විවාහ දීමනා ... ... | 200 | 0 |
| ඒ.—(2) (ඒ) දීමනා ... ... ... | 300 | 0 |
| ඒ.—(2) (ජී) වාහන තහඩු ... ... | 20 | 0 |
| ඒ.—(2) (එම්) නිල ඇඳුම් ... ... | 250 | 0 |
| බී.—(1) (සී) කම්කරු වේතන ... ... | 2,750 | 0 |
| සී.—(4) නගර සභාවේ ගොඩනැගිලි නඩත්තුව ... | 300 | 0 |
| ඩී.—(1) (එෆ්) විෂබීජ නාශක ද්‍රව්‍ය ... ... | 200 | 0 |
| ඩී.—(3) (ඒ) වැසිකිළි පවිත්‍ර කිරීමේ කම්කරු වේතන ... | 4,200 | 0 |
| ඩී.—(3) (අයි) විවාහ දීමනා ... ... | 75 | 0 |
| ඩී.—(6) (ඒ) වේතන ... ... ... | 200 | 0 |
| ඊ.—(7) විනෝද බදු පරීක්ෂාව ... ... | 130 | 0 |
| එකතුව ... | 12,125 | 0 |

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (බී) ලිපිකරුවන් ... ... | 1,200 | 0 |
| ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 850 | 0 |
| ඒ.—(2) (ජේ) අනියම් වියදම් ... ... | 1,000 | 0 |
| ඒ.—(2) (කේ) කාර්යාලීය උපකරණ ... ... | 475 | 0 |
| බී.—(12) මහාමාර්ග අළුත්වැඩියාව ... ... | 1,850 | 0 |
| ඩී.—(1) (එච්) කාණු ඉදිකිරීම් ... ... | 1,500 | 0 |
| ඩී.—(2) (ඒ) කසළ ශෝධක කම්කරු වේතන ... | 1,250 | 0 |
| ඩී.—(2) (බී) කරත්ත ලොරි ... ... | 3,100 | 0 |
| ඩී.—(3) (බී) කරත්ත ලොරි ... ... | 200 | 0 |
| ඩී.—(5) (එච්) ප්‍රසිද්ධ නාන පොකුණු ... ... | 500 | 0 |
| ඩී.—(7) (බී) වෙළඳ පොල නඩත්තුව ... ... | 200 | 0 |
| එකතුව ... | 12,125 | 0 |

විදුලිය අංශය—I වන කොටස

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | රු. | ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඊඩී.—(3) (ඒ) වැටුප් හා වේතන | 2,750 | 0 | ඊඩී.—(1) (ඒ) විදුලිය ගාස්තු | 12,650 | 0 |
| ඊඩී.—(3) (බී) විවාහ දීමනා | 200 | 0 | ඊඩී.—(3) (එච්) විශාම වැටුප් | 115 | 0 |
| ඊඩී.—(3) (සී) අතිකාල දීමනා | 50 | 0 | ඊඩී.—(3) (ජේ) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ගාස්තු | 1,500 | 0 |
| ඊඩී.—(3) (ඊ) ගමන් වියදම් | 200 | 0 | ඊඩී.—(3) (කේ) බැංකු ගාස්තු | 125 | 0 |
| ඊඩී.—(4) (ඒ) වැටුප් හා වේතන | 1,900 | 0 | ඊඩී.—(3) (එම්) ගණන් පරීක්ෂණ ගාස්තු | 1,000 | 0 |
| ඊඩී.—(4) (බී) මීටර් සහ අනිකුත් උපකරණ | 2,900 | 0 | ඊඩී.—(4) (බී) විවාහ දීමනා | 30 | 0 |
| ඊඩී.—(6) (ඒ) (II) නඩත්තු කිරීම | 4,000 | 0 | ඊඩී.—(4) (ඩී) අනතුරු දීමනා | 30 | 0 |
| ඊඩී.—(6) (බී) (1) තාවකාලික කම්කරු ගාස්තු | 3,450 | 0 | | | |
| එකතුව | 15,450 | 0 | එකතුව | 15,450 | 0 |

II වන කොටස

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඊඩී.—(9) විදුලිබල උප මධ්‍යස්ථානය | 2,600 | 0 | ඊඩී.—(15) වීථි ආලෝක කිරීම | 1,000 | 0 |
| ඊඩී.—(13) ලී බඩු කාර්‍යාලීය උපකරණ | 160 | 0 | ඊඩී.—(16) අළුත් මාර්ග දීර්ඝ කිරීම | 2,360 | 0 |
| ඊඩී.—(17) ඉඩම් සහ ගස් කැපීමේ වන්දි | 600 | 0 | | | |
| | 3,360 | 0 | | 3,360 | 0 |

දයා කුලරත්න,
සභාපති,
පිළියන්දල උප නගර සභාව.

1973 ඔක්තෝබර් මස 19 වැනි දින,
පිළියන්දල උප නගර සභා කාර්‍යාලයේ දීය.

11-166—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

# දේපල විකිණීම්

## අලව්ව සුළු නගර සභාව

### හිඟ වරිපනම් ගාස්තු නොගෙවීම නිසා දේපොල විකිණීමයි

1972 දෙසැම්බර් මස 31 වනදයින් අවසන් වන වර්ෂය වෙනුවෙන් මීට යාව ඇති උපලේඛනයේ සඳහන් දේපොල සම්බන්ධයෙන් ලැබිය යුතු හිඟ වරිපනම් බදු, අයකර ගැනීමට, තහනම් කිරීම සඳහා වංචල දේපොල නොමැතිවූ කල්හි, මහනගර සභා ආඥාපනතේ (252 වන අධිකාරිය) 252 වැනි ඡෙදයේ ප්‍රකාර අලව්ව සුලු නගර සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද, (1) කුලී සහ ලාභ (2) ද්‍රව්‍ය සහ උපදින ද්‍රව්‍ය (3) ගෙයි උපකරන සහ (4) පහත සඳහන් දේපලම ඒ දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු යථාකාලයේදී ගෙවනු නොලැබුවහොත්, එකී උපලේඛණයේ සඳහන් දිනයන්හි පෙරවරු 8.00 සිට ආරම්භ කොට එකී දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

බී. ඒ. ධර්මසේන,
ලේකම්,
අලව්ව සුලු නගර සභාව.

1973 ඔක්තෝබර් 22 දින,
අලව්ව සුලු නගර සභා කාර්යාලය.

උප ලේඛණය

**කොට්ඨාශ අංක 1—මහඔය**

කුරුණෑගල පාර

1973 දෙසැම්බර් මස 27 නුව දින පෙරවරු 8.00 සිට

27, 271/1, 37, 39,49, 49/1, 121, 143, 173/1, 255, 329/1, 395, 397, 120, 234, 236, 584, 554, 654, 49/4, 55.

**කොට්ඨාශ අංක 3—බරාඋවක්ක**

දම්පැලැස්ස පාර

1973 දෙසැම්බර් 28 පෙරවරු 8.00 සිට

165/10, 223, 337, 335/9, 395, 397, 399, 407/3, 204, 282, 296/4, 320, 324, 352, 356/1, 135, 137, 139, 141, 143, 145, 142, 166, 128 130, 130/1, 132, 134, 138, 142, 166.

**කොට්ඨාශ අංක 2—අලව්ව**

ජනරජ මාවත

1974 ජනවාරි මස 03 වන දින පෙරවරු 8.00 සිට

51, 55, 57, 161, 97/2, 42, 160.

පාසැල පටුමග

12

**කොට්ඨාශ අංක 5—පරමාඋල්ල**

1974 ජනවාරි මස 04 දින පෙරවරු 8.00 සිට

14, 19/11, 167, 169, 175, 206, 208, 402/3, 402/5, 402/5, 497/2, 42,160.

දෙඩම් කුඹුර පාර

190

11-8—72.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## තිස්සමහාරාම සුළු නගර සභාව

### 1974 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)**

(477 වැනි අධිකාරය වන) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර, තිස්සමහාරාම සුළු නගර සභා බල මණ්ඩලය තුල තබා ගෙන සිටින සුනඛයින් සඳහා පිරිමි සත කුට රුපියල් එක බැගින් ද, ගෑණු සතෙකුට රුපියලකුත් ශත පනහ බැගින් ද, 1974 මාර්තු 31 වැනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින්, ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් 1974 වර්ෂයට අය කිරීමට පනවා ඇති බවත්, තත් නගර සභාව මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආර්. විජේදාස,
පරිපාලන නිලධාරි,
තිස්සමහාරාම සුළු නගර සභාව.

11-56/1—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

## තිස්සමහරාම සුළු නගර සභාව

### 1974 සඳහා වූ දේපල බද්ද

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ ගත වී යන මෙම වර්ෂයට බල පවත්නා පහත සඳහන් බදු 1974 වර්ෂයටද ඒලෙසම පැනවීමට තිස්සමහරාම සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 (2) වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හත බැගින් වාර්ෂික බදු පිළිවෙලින් ජූනි 30 සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු හය මසකට වරක් බැගින් ගෙවිය හැකි වේ.

ආර්. විජේදාස,
පරිපාලන නිලධාරී,
තිස්සමහරාම සුළු නගර සභාව.

1974 ඔක්තෝබර් මස 17 වැනි දින,
තිස්සමහරාම සුළු නගර සභා කාර්යාලයේදීය.

11–56/2—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## තිස්සමහරාම සුළු නගර සභාව

### 1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

තිස්සමහරාම සුළු නගර සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛණයේ විස්තර වන ගණන් අනුව 1974 වර්ෂයට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමට ද,

(2) එකී ආඥාපනතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින් ද වේ.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි, රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | 5 | 0 |
| සැම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 3 | 0 |
| (ආ) වෙළඳාම හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... | 1 | 0 |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බැඳි සැම කරත්තයක් සඳහාම ... ... ... | 4 | 0 |
| තනි ගොනා බැඳි සැම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහාම ... | 2 | 50 |
| සැම අත් කරත්තයක් සඳහාම ... | 2 | 50 |
| සැම ජින් රික්ෂෝ රථයක් සඳහාම ... | 2 | 50 |
| සැම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වරථයක් සඳහා... | 5 | 0 |
| සැම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... | 1 | 0 |

ආර්. විජේදාස,
පරිපාලන නිලධාරී,
තිස්සමහරාම සුළු නගර සභාව.

1973 ඔක්තෝබර් 17 වැනි දින,
තිස්සමහරාම සුළු නගර සභා කාර්යාලයේදීය.

11–56/3—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## මාදම්පේ සුළු නගර සභාව

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ 161 වැනි සහ 163 වැනි වගන්ති යටතේ මාදම්පේ සුළු නගර සභාව විසින් මෙහි පහත උපලේඛනගත බලපත්‍ර වෙනුවෙන්ද එහි නිශ්චිතව සටහන් බලපත්‍ර ගාස්තු 1974 වර්ෂයේ 01 වැනි දින පටන් බලපැවැත්වෙන සේ පණවා අයකිරීමට 1973 වර්ෂයේ අගෝස්තු 31 වැනි දින පැවැත්වුණු මාසික රැස්වීමේදී තීරණය කරනු ලැබූ බව මෙයින් කාරුණිකව දනුම් දෙමි.

එස්. සේගු ඉබ්‍රාහිම්,
මාදම්පේ සුළු නගර සභාවේ සභාපති.

1973. ඔක්තෝබර් 22 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
මාදම්පේ.

#### උපලේඛනය

පහත දක්වෙන කාර්‍ය්‍යයන් සඳහා යම් ස්ථානයක් පාවිච්චි කිරීමට බලය ලබා දෙන බලපත්‍රයන් :—

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| 1. දේපල බද්ද— | | |
| දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හයක බද්දක් | | |
| 2. විශේෂ කසල බද්ද— | | |
| දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට තුනක කසල ශෝධන විශෙෂ වරිපනම් බද්දක් | | |
| 3. වාහන හා සතුන් පිළිබඳ බද්ද— | | |
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා වර්ෂයකට ... ... | 5 | 0 |
| සැම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් සඳහා වර්ෂයකට : | | |
| වෙළඳාම සඳහා පාවිච්චි කිරීම ... ... | 5 | 0 |
| වෙළඳාම හැර වෙනත් කාර්‍ය්‍යයක් සඳහා ... | 1 | 0 |
| ගොන් දෙන්නා බඳින සැම කරත්තයක් සඳහා හෝ තිරික්කලයක් සඳහා වර්ෂයකට ... ... | 4 | 0 |
| තනි ගොනා බඳින සැම කරත්තයක් සඳහා හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| සැම අත් කරත්තයක් සඳහා වර්ෂයකට ... ... | 2 | 0 |
| සැම ජින් රික්ෂෝ රථයක් සඳහා වර්ෂයකට ... | 2 | 50 |
| සැම අශ්වයෙක් හෝ පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා වර්ෂයකට ... ... | 1 | 0 |
| සැම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා වර්ෂයකට ... | 1 | 0 |
| බල්ලෙක් සඳහා වර්ෂයකට ... ... | 1 | 0 |
| බැල්ලියක් සඳහා වර්ෂයකට ... ... | 1 | 50 |
| 4. විනෝද බද්ද— | | |
| ශත විස්සකට නොඅඩු එහෙත් ශත පණහකට නොවැඩි ප්‍රවේශ පත්‍රයකට ... ... | 0 | 05 |
| ශත පණහකට වැඩි එහෙත් රුපියලකට නොවැඩි ප්‍රවේශ පත්‍රයකට ... ... | 0 | 10 |
| රුපියලකට වැඩි එහෙත් රු. 1.50 ට නොවැඩි ප්‍රවේශ පත්‍රයකට | 0 | 15 |
| රු. 1.50ට වැඩි එහෙත් රු. 2.00ට නොවැඩි ප්‍රවේශ පත්‍රයකට | 0 | 20 |
| රු. 2.00 ට වැඩි එහෙත් රු. 3.00 ට නොවැඩි ප්‍රවේශ පත්‍රයකට | 0 | 30 |
| රු. 3.00 ට වැඩි එහෙත් රු. 4.00 ට නොවැඩි ප්‍රවේශ පත්‍රයකට | 0 | 40 |
| රු. 4.00 ට වැඩි එහෙත් රු. 5.00 ට නොවැඩි ප්‍රවේශ පත්‍රයකට | 0 | 50 |
| රු. 5.00 ට වැඩි එහෙත් රු. 10.00 ට නොවැඩි ප්‍රවේශ පත්‍රයකට | 1 | 0 |
| රු. 10.00 ට වැඩි පළමුවැනි රු. 10.00ට | 1 | 0 |
| ඊට වැඩි වන සැම රු. 5.00 ට හෝ ඉන් කොටසකට ... | 1 | 0 |

1973 වර්ෂය වෙනුවෙන් පනවා අය කරනු ලබන සහ 1974 වර්ෂයේදී පනවා අයකිරීමට බලාපොරොත්තු බලපත්‍ර ගාස්තු

| | බලපත්‍රයේ ස්වභාවය | දැනට අයකරනු ලබන ගාස්තුව රු. | ශ. |
|---|---|---|---|
| 1. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යැම... ... | 10 | 0 |
| 2. | තේ පැන් ශාලාවක් පවත්වාගෙන යැම— | | |
| | කෝපි කඩයක් පවත්වාගෙන යැම | | |
| | ගොඩනැගිල්ලේ වාර්ෂික වටිනාකම රු. 200 ට නොවැඩි | 10 | 0 |
| | ගොඩනැගිල්ලේ වාර්ෂික වටිනාකම රු. 200 ට වැඩි සහ රු. 300 ට නොවැඩි ... ... | 20 | 0 |
| | ගොඩනැගිල්ලේ වාර්ෂික වටිනාකම රු. 300ට වැඩි ... | 35 | 0 |
| 3. | තේ පැන් සහිත භෝජනශාලාවක් පවත්වාගෙන යැම ... | 40 | 0 |
| 4. | බේකරියක් පවත්වාගෙන යැම ... ... | 60 | 0 |
| 5. | එළවළු වෙළඳ සැලක් පවත්වාගෙන යැම/පළතුරු ... | 15 | 0 |
| 6. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යැම— | | |
| | එක් සේවකයෙක් සේවයේ යොද ඇති ස්ථානයකින් ... | 15 | 0 |
| | සේවකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩියෙන් යොද ඇති ස්ථානයකින් ... ... | 30 | 0 |
| 7. | ටයර් සහ ටියුබ වෝල්කනයිෂින් කරන ස්ථානයකින් ... | 10 | 0 |
| 8. | මිරිස් හෝ කුළුබඩු ඇඹරුම් ස්ථානයකින් ... | 25 | 0 |
| 9. | හාල් මෝලක් පවත්වාගෙන යැම ... ... | 150 | 0 |
| 10. | බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යැම | 15 | 0 |
| 11. | වඩුමඩුවක් පවත්වාගෙන යැම ... ... | 10 | 0 |
| 12. | ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කිරීම ... ... | 30 | 0 |
| 13. | මෝටර් රථ වාහන අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යැම ... ... | 30 | 0 |
| 14. | ස්වර්ණාභරණ සැලක් පවත්වාගෙන යැම ... | 15 | 0 |
| 15. | සිමෙන්ති, තීන්ත සහ වාර්නිෂ් ගබඩා කිරීම ... | 20 | 0 |
| 16. | මුද්‍රණාලයක් පවත්වාගෙන යැම ... ... | 30 | 0 |
| 17. | ලී ගබඩාවක් පවත්වාගෙන යැම ... ... | 20 | 0 |
| 18. | කම්මලක් පවත්වාගෙන යැම ... ... | 20 | 0 |
| 19. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යැම ... | 10 | 0 |
| 20. | භූමිතෙල් ගබඩාවක් පවත්වාගෙන යැම ... | 250 | 0 |
| 21. | නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය හෝ සිල්ලර ද්‍රව්‍ය විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යැම— | | |
| | ගොඩනැගිල්ලේ වාර්ෂික වටිනාකම රු. 240 ට වැඩි ස්ථානයකින් ... ... | 45 | 0 |
| | ගොඩනැගිල්ලේ වාර්ෂක වටිනාකම රු. 240 ට අඩු ස්ථානයකින් ... ... | 20 | 0 |
| 22. | අවමංගල්‍ය භාණ්ඩ විකුණන ස්ථානයකින් ... | 25 | 0 |
| 23. | කෘතිම පෝර ගබඩාවකින් ... ... | 25 | 0 |
| 24. | මස් කඩයක් පවත්වාගෙන යැම සඳහා... ... | 100 | 0 |
| 25. | මාළු වෙළඳාම සඳහා පෞද්ගලික වෙළඳ පොලක් පවත්වාගෙන යැම ... ... | 50 | 0 |

1974 වර්ෂයේ පටන් පනවා අයකිරීමට බලාපොරොත්තු වන බලපත්‍ර ගාස්තු

| | | රු. | ශ. |
|---|---|---|---|
| 1. | බීඩි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යැම ... | 100 | 0 |
| 2. | කොප්පරා මඩුවක් පවත්වාගෙන යැම ... | 50 | 0 |
| 3. | අයිස්ක්‍රීම් වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යැම | 10 | 0 |
| 4. | රසකැවිලි සාදන ස්ථානයක් පවත්වාගෙන යැම ... | 20 | 0 |
| 5. | කොප්පරා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යැම... | 25 | 0 |
| 6. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යැම ... | 10 | 0 |
| 7. | සිසිල්බීම ග්‍රෝස් එකකට වඩා ගබඩා කිරීම සඳහා ... | 20 | 0 |
| 8. | පැට්‍රල් සහ වෙනත් ඉන්දන ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යැම ... ... | 50 | 0 |
| 9. | ග්‍රෝස් දහයකට වඩා ගිනිපෙට්ටි ගබඩා කිරීම ... | 5 | 0 |
| 10. | මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම ... ... | 10 | 0 |
| 11. | ගැලුම් පණහකට වඩා පොල්තෙල් ගබඩා කිරීම ... | 25 | 0 |
| 12. | ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| 13. | කොහු හෝ කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩාකර තැබීම | 25 | 0 |
| 14. | පාවිච්චි කළ ඇඳුම් කබඩාකර තබාගැනීම ... | 10 | 0 |
| 15. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යැම ... ... | 50 | 0 |
| 16. | දර ගබඩාවක් පවත්වාගෙන යැම ... ... | 5 | 0 |
| 17. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යැම ... ... | 100 | 0 |
| 18. | රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... | 25 | 0 |
| 19. | කරවල, ලුණුමාළු හෝ ජාඩි හොන්ඩර තුනකට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම ... ... | 20 | 0 |
| 20. | පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... ... | 5 | 0 |
| 21. | මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කල භාණ්ඩ ගබඩා කර තබා ගැනීම... ... | 15 | 0 |
| 22. | රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යැම ... | 50 | 0 |
| 23. | පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම ... | 20 | 0 |
| 24. | ඩ්‍රයික්ලීන් කරන ස්ථානයක් හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යැම ... ... | 10 | 0 |
| 25. | ලොන්ඩරියක් පවත්වාගෙන යැම ... ... | 10 | 0 |
| 26. | විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කරන වැඩපොලක් හෝ ගුවන් විදුලි නිපදවීමේ වැඩපලක් පත්වාගෙන යැම ... ... | 25 | 0 |
| 27. | මෝටර් වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යැම ... ... | 25 | 0 |
| 28. | අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් ක්‍රමයකින් රෙදි නිපදවීම | 50 | 0 |
| 29. | කුකුලන් සියයකට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යැම ... | 20 | 0 |
| 30. | ප්‍රසිද්ධ දර්ශනබලපත්‍ර සිනමා ශාලාවක් පවත්වාගෙන යැම | 200 | 0 |
| 31. | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යැම ... | 50 | 0 |
| 32. | ගෝනි ගබඩා කිරීම සඳහා ... ... | 10 | 0 |
| 33. | කිරිපට්ටියක් තබා ගැනීම සඳහා— | | |
| | දෙනුන් එකේ සිට තුන දක්වා ... ... | 10 | 0 |
| | දෙනුන් තුනේ සිට දහය දක්වා ... ... | 25 | 0 |
| 34. | සංචාරක වෙළෙන්දෝ ... ... | 5 | 0 |
| 35. | රට බිම සාප්පුවක් පවත්වාගෙන යැම ... ... | 100 | 0 |

11-160—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ පත්තිල් පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නම සඳහන් අය විසින් එකී උපලේඛනයෙහි සඳහන් ස්ථානයෙහි සතුන් මරා මස් කිරීම පිණිස 1974 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව පත්තිලපත්තු ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට ඒ සඳහා තමා විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාදැයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් 2 කින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, 1947 අංක 44 දරණ අඥාපනතේ 6 වන පරිච්ඡේදයෙන් සංශෝධිත මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වන පරිච්ඡේදය) 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි,

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය |
|---|---|
| 1. ඇම්. ඒ. ඇස්. කාටුබාවා ... | උඩුවිලතැන්න, යාගින්න, කහවත්ත. |

ජී. ඇන්. ජයසුන්දර,
අටකලන් කෝරළේ පත්තිල් පත්තු ගම්සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 18 වෙනි දින,
පත්තිල් පත්තු ගම්සභා කාර්යාලය,
වැල්ලඳුර, කහවත්ත.

11-65—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ දඩුගම්පේරුව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛණයෙහි දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව, දඩුගම්පේරුව ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට ඒ සඳහා තමා විරුද්ධ වන්නේ අසවල් කාරණා නිසායැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| | අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| 1. | ඇස්. සුමනාවති මහත්මිය, 134ඒ, ''ලක්මලී'', දඩුගම, ජාඇල ... | දඩුගම අංක 1—දඩුගම කඩ හතර හංදිය ... ... | එළ හරක් මස් |
| 2. | එච්. නෙල්සන් ප්‍රනාන්දු මහතා, දඩුගම, ජාඇල ... | දඩුගම අංක 2—දඩුගම විවිධ සේවා සමුපකාරය අසළ ... | එළ හරක් මස් |
| 3. | කේ. ජෝනස් පෙරේරා මහතා, දඩුගම, ජාඇල ... | දඩුගම අංක 3—දෙහියාගාත කුරුස හංදිය ... | එළ හරක් මස් |
| 4. | වයි. ජෝෂප් ප්‍රනාන්දු මහතා, 503, දඩුගම, ජාඇල ... | කුඩහකපොල අංක 1—කුඩහකපොල දුම්රියපළ අසළ ... | එළ හරක් මස් |
| 5. | ඒ. ජේ. ඇල්. ප්‍රිමන් පෙරේරා මහතා, කුඩැල්ල, ජාඇල ... | කුඩැල්ල අංක 1—කුඩැල්ල පල්ලිය අසළ ... | එළ හරක් මස් |
| 6. | වයි. ලැඩ් ජොනතන් ප්‍රනාන්දු මහතා, කුඩැල්ල, ජාඇල ... | කුඩැල්ල අංක 2—කුඩැල්ල හංදිය ... ... | එළ හරක් මස් |
| 7. | කේ. ප්‍රැන්සිස් පෙරේරා මහතා, 178, දඩුගම, ජාඇල ... | දඩුගම කොටුපළ ඌරුමස් කඩය—දඩුගම තොටුපළ අසල ... | ඌරු මස් |
| 8. | කේ. පිලික්ස් පෙරේරා මහතා, කුඩැල්ල, ජාඇල ... | ඒකළ අඩි 60—ඒකළ අඩි 60 අසළ ... ... | එළ හරක් මස් |
| 9. | ඇම්. ඇස්. හුසේන් මහතා, ගල්ලොලුව, මීනුවන්ගොඩ ... | කොටුගොඩ මස්කඩය—කොටුගොඩ පල්ලිය අසළ් ... | එළ හරක් මස් |
| 10. | කේ. ජෝෂප් පැට්‍රික් පෙරේරා මහතා, දැලතුර, ජාඇල ... | දැලතුර මස් කඩය—දැලතුර පල්ලිය අසළ ... | එළ හරක් මස් |
| 11. | ඊ. ප්‍රැන්සිස් සේරම් මහතා, මාඑළිය, ජාඇල ... ... | ඒකළ කුරුඳුවත්ත මස්කඩය—ඒකළ කුරුඳුවත්ත ... | එළ හරක් මස් |
| 12. | ඊ. ප්‍රැන්සිස් සේරම මහතා, මාඑළිය, ජාඇල ... ... | ඒකළ මස්කඩය—ඒකළ මඩම හංදිය ... ... | එළ හරක් මස් |

ඊ. තෝමස් ඩැනිස්ටර් පෙරේරා,
පරිපාලන නිලධාරී,
දඩුගම්පේරුව ගම්සභාව.

1973.10.13 වැනි දින,
දඩුගම් පේරුව ගම්සභා කාර්යාලයේ දීය.

11–11—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## නුවරඑළිය මහ නගර සභාව

### 1973 වර්ෂයේ 1 වැනි පරිපූරක අය-වැය

නුවරඑළිය මහ නගර සභාවේ 1973 වර්ෂයේ 1 වැනි පරිපූරක අය වැය ලේඛනය, 1973 නොවැම්බර් මස 2 වැනි දින සිට දින හතක්, මහජනයාගේ පරීක්ෂණය සඳහා මහ නගර සභා කාර්යාලයේ තබා ඇති බව (ලංකා නීති ප්‍රඥප්තියේ 252 වන අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 214 (2) (බී) ඡේදය අනුව මෙයින් දැනුම් දෙමි.

ඊ. විලියම් ප්‍රනාන්දු,
නුවර එළියේ නගරාධිපති.

1973 ඔක්තෝබර් මස 18 වන දින,
නුවරඑළිය, නාගරික සභා කාර්යාලයේ දී ය.

11–30—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ අළුත්නුවර ගම්සභාව

### හෙම්මාතගම නගරයේ දියුණු ගම්මණ්ඩි ප්‍රදේශයේ සීමාවන් දීර්ඝ කිරීම

1968 ජනවාරි 26 වෙනි දින අංක 14,786 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ පළ කරන ලද, හෙම්මතගම දියුණු ගම් ප්‍රදේශයේ සීමාවන් පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රකාර දීර්ඝ කිරීමට, ගම්සභා ආඥාපනතේ (257 අධිකාරය) 37 (2) (ඒ) වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව ප්‍රකාශයට පමුණුවා ඇති බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

**මාවනැල්ල පාර:** 1968. 01. 26 දින අංක 14,786 දරණ ගැසට් පත්‍රය අනුව උතුරට දක්වා ඇති හෙම්මාතගම-මාවනැල්ල රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තු පාර, ගිනිහපිටිය-තඹවිට පාර සමග සන්ධිවන ස්ථානයේ මධ්‍යම ලක්ෂයේ සිට මාවනැල්ල දෙසට රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තු පාරේ 1/8 පාලම දක්වා එකී පාරේ මධ්‍යම රේඛාවට සරල සමාන්තරව දෙපසින් දම්වැල් දෙක බැගින් දුරින් වූ රේඛා දෙකෙන් සීමාවූ කොටස ද,

**ගම්පොල පාර:** එකී ගැසට් නිවේදනයේ හෙම්මාතගම-ගම්පොල රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තු පාරේ අවසාන වරට සඳහන් කළ ලක්ෂයේ සිට ඉදිරියට එනම් ගම්පොල දෙසට හෙම්මාතගම-ගම්පොල රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තු පාරේ කෙහෙල්පන්නල මංසන්ධිය දක්වා එකී පාරේ මධ්‍යම රේඛාවට සරල සමාන්තරව දෙපසින් දම්වැල් දෙක බැගින් දුරවූ රේඛා දෙකින් සීමාවූ කොටස ද,

**හොරේවල පාර:** එකී ගැසට් නිවේදනයේ මාවනැල්ල-අරණායක රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තු පාරේ අවසාන වරට සඳහන් කළ ලක්ෂයේ සිට ඉදිරියට එනම්, මාවනැල්ල-අරණායක රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තු පාරේ 2/9 බෝක්කුව දක්වා එකී පාරේ මධ්‍යම රේඛාවට සරල සමාන්තරව දෙපසින් දම්වැල් දෙකකින් සීමා වූ කොටස ද,

**දිප්පිටිය පාර:** එකී ගැසට් නිවේදනයේ හෙම්මාතගම-දිප්පිටිය රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තු පාරේ, අවසාන වරට සඳහන් කළ ලක්ෂයේ සිට ඉදිරියට එනම් දිප්පිටිය දෙසට හෙම්මාතගම-දිප්පිටිය රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තු පාරේ නව වැනි බෝක්කුව දක්වා එකී පාරේ මධ්‍යම රේඛාවට සරල සමාන්තරව දෙපසින් දම්වැල් දෙක බැගින් දුරින් වූ රේඛා දෙකෙන් සීමාවූ කොටස ද වේ.

පී. ආර්. රත්නායක,
සභාපති,
අළුත්නුවර ගම්සභාව.

අළුත්නුවර ගම්සභා කාර්යාලය,
ඇල්පිටිය, පරණගම,
1973 ඔක්තෝබර් මස 20 වෙනි දින දී ය.

11–74—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

## දකුණු විලච්චිය කෝරළේ ගම්සභාව

**හැඳින්වීම** :—මෙම අතුරු ව්‍යවස්ථා දකුණු විලච්චිය කෝරළේ ගම් සභාවේ ආදර්ශ ග්‍රාමීය පුස්තකාලය සඳහා වූ අතුරු ව්‍යවස්ථා නම් වේ.

1. දකුණු විලච්චිය කෝරළේ ගම් සභාව මගින් පාලනය කරනු ලබන පුස්තකාලය පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත වේ.

(අ) මහජන පුස්තකාලය

(ආ) කියවීම් ශාලාව හා ළමා අංශය.

2. (1) මෙම පුස්තකාලය හා කියවීම් ශාලාව පිළිබඳ සම්පූර්ණ වගකීම් හා පාලනය දකුණු විලච්චිය කෝරළේ ගම් සභාවේ සභාපති තුමා සතුවේ. පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරව පාලනය කිරීම සම්බන්ධයෙන් ඔහුට උපදෙස් ලබා ගැනීම සඳහා සුදුසු උපදේශක මණ්ඩලයක් පත් කර ගත හැකිය.

2. (2) පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරව පැවැත්වීම හා පාලනය කිරීම ආදී කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම පුස්තකාලයාධිපති වෙත පැවරේ.

3. පුස්තකාල සේවයේ ඕනෑම අංශයක් ඕනෑම කෙනෙකුට හෝ අනුමත කරන ලද ප්‍රජාමංඩලයකට පාවිච්චි කිරීමට අවසරදීම් හෝ නොදීම හෝ ගම් සභාවේ සභාපති තුමා සතු බලයකි. තවද පාලන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කරන ඕනෑම කෙනෙකුට හෝ ප්‍රජාමංඩල යකට මෙම අවසරය නොදී සිටීමට ගම් සභාවේ ප්‍රධාන තුමාට බලය තිබේ.

4. (1) මහජන පුස්තකාලයේ සාමාජිකයෙක් වීමට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(අ) වයස අවුරුදු 12 කට අඩු නොවීම,

(ආ) සාමාන්‍යයෙන් ලියන්නට කියන්නට දැනගත් අයෙකු වීම,

(ඇ) ගම් සභා ප්‍රදේශය තුල පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුළ රක්ෂාවක යෙදී සිටින කෙනෙකු වීම,

(ඈ) පුස්තකාලයාධිපති වෙත රු. 5 ක ඇප මුදලක් තැන්පත් කර තිබීම.

4. (2) සාමාජිකත්වය ලබා ගැනීමට කැමති අයවළුන් පුස්තකාල යාධිපති ගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර සම්පූර්ණ කර ඒවා පහත සඳහන් අයකු ලවා සහතික කරවා පුස්තකාලයාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය :—

(අ) ජාතික රාජ්‍ය සභා නියෝජිතයෙකු,

(ආ) සමාදාන විනිශ්චයකාරවරයෙකු,

(ඇ) ගම්සභා ප්‍රදේශය තුල සභා නියෝජිතයෙකු,

(ඈ) පැවිදිවරයෙකු හෝ පූජකයෙකු,

(ඉ) පුස්තකාල උපදේශක කමිටුවේ සාමාජිකයෙකු,

(ඊ) පිළිගත් වෛද්‍ය වරයෙකු හෝ නීතිඥවරයෙකු,

(උ) රු. 100 ට නොඅඩු මූලික මාසික වැටුපක් ලබන ගම් සභා කොට්ඨාශයේ පදිංචි පලාත් පාලන සේවයේ නිලධාරියෙකු,

(ඌ) රජයේ ලියා පදිංචි කරන ලද පාසැලක ප්‍රධානාචාර්ය වරයෙකු හෝ විදුහල්පති වරයෙකු.

4. (3). 4 (2) ව්‍යවස්ථාව අනුව අයදුම්පතක් සහතික කිරීමට ඇති සුදුසුකම් ඇති අයෙකුට තමගේ අයදුම් පත්‍රය සම්බන්ධයෙන් එවැනි සහතිකයක් අත්සන් කළ නොහැක.

4. (4) පුස්තකාලයේ සාමාජිකත්වය ලැබීම සඳහා ප්‍රජා මංඩල වලට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(අ) සාමාජිකත්වය අපේක්ෂා කරනු ලබන ප්‍රජා මංඩලය ගම් සභාව විසින් ලියා පදිංචිය සඳහා අනුමත කර තිබීම.

(ආ) සාමාජිකයන් 20 කට වඩා වැඩි ගණනක් සිටින ප්‍රජා මංඩල යක් වීම.

(ඇ) ගම් සභා ප්‍රදේශය තුළ පිහිටි ප්‍රජා මංඩලයක් වීම.

(ඈ) පුස්තකාලයාධිපති වෙත රු. 25 ක ඇප මුදලක් තැන්පත් කර තිබීම.

(ඉ) පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගත යුතුය යනුවෙන් ප්‍රජා මංඩලීය මහා සභා රැස්වීමකදී සම්මත කර ගෙන තිබීම.

(ඊ) පුස්තකාලයෙන් භාරගනු ලබන පොත්වල වගකීම ප්‍රජා මංඩලයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන නිලධාරි මහතුන් තිදෙනා විසින් දැරිය යුතු බවට ප්‍රජා මණ්ඩලයේ මහා සභා රැස්වීමකදී සම්මත කර තිබීම.

4. (5) සාමාජිකත්වය ලබා ගැනීමට කැමති ප්‍රජා මණ්ඩල පුස්තකාලයාධිපති ගෙන් ලබා ගත හැකි විශේෂ ආකෘති පත්‍ර සම්පූර්ණ කර ඒවා 4(2) වැනි ව්‍යවස්ථාවේ විස්තර කර ඇති අයවළුන් අතුරෙන් දෙදෙනෙකු ලවා සහතික කරවා පුස්තකාලයාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

5. (1) පුස්තකාලයේ සාමාජිකත්වය ලැබූ සෑම අයෙකුටම සාමාජික පත්‍රය බැගින් දෙනු ලැබේ. මෙම සාමාජික පත්‍රයට වරකට එක පොත බැගින් ලබා ගත හැකිය.

5. (2) පුස්තකාලයේ සාමාජිකත්වය ලැබූ සෑම ප්‍රජා මංඩලයකටම සාමාජික පත්‍රයක් නිකුත් කරනු ලැබේ. එම සාමාජික පත්‍රයට වරකට පොත් 10 බැගින් ලබා ගත හැකිය. මෙම පොත් භාර ගැනීමේදී ඉතා අඩු වයෙන් එම ප්‍රජා මංඩලයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තිදෙනාගෙන් දෙදෙනෙකුවත් ඒ අවස්ථාවේදී පොත් බෙදා දීමේ පත්‍රිකාවේ අත්සන් කළ යුතුය.

6. පොත් ගෙන යනු ලබන සෑම සාමාජිකයෙකුම එසේ ගෙන යනු ලබන පොත් නැවත පුස්තකාලයට භාරදෙන තුරු සම්පූර්ණ යෙන්ම වග කිව යුතුය.

7. 5 වැනි රීතිය යටතේ සාමාජිකයකු විසින් ලබා ගන්නා ලද සාමාජික පත්‍රයක් නැති වුවහොත් වහාම ඒ බව පුස්තකාලයාධිපති වෙත දැන්විය යුතුය. එම සාමාජික පත්‍රය මත පුස්තකාලයෙන් පොතක් ලබා ගෙන නොමැති බැව් පුස්තකාලයාධිපතිට හොඳාකාර ඒත්තු ගියහොත් ඔහු විසින් එම සාමාජිකයාට සාමාජික පත්‍රයේ අනු පිටපතක් නිකුත් කරනවා ඇත. සාමාජික පත්‍රයක් නැතිවූ බවට දැනුම් දී දින 30 ක් ගතවෙන තුරු නැතිවූ සාමාජික පත්‍රය වෙනුවට අනු පිටපතක් පුස්තකාලයාධිපති විසින් නිකුත් කරනු නොලැබේ.

8. පුස්තකාලයෙන් ලබා ගන්නා ලද සෑම පොතක්ම එය ලබා ගත් දින සිට දින 14 ක් ඇතුළතදී පුස්තකාලයාධිපතිට ආපසු භාරදිය යුතුය. වෙනත් යම් සාමාජිකයකුට එම පොත අවශ්‍ය නොවුවහොත් තවත් දින 14 ක් එය ඔහු වෙතම තබා ගැනීමට පුස්තකාලයාධිපති ගෙන් අවසරය ලබා ගත හැක.

9. 8 වන රීතියේ ප්‍රකාර දින 14 ක් ඇතුළතදී යම් සාමාජිකයෙක් විසින් තමා ගන්නා ලද පොත් ආපසු භාර නුදුන්නොත් 15 දින සිට ඉන් ඉදිරියට ප්‍රමාද කරන සෑම දිනයකටම පොතකට ශත 10 බැගින් වූ දඩ මුදලක් නියම කරනවා ඇත.

10. යම් සාමාජිකයෙකු ලබාගත් පොතක් 8 වන රීතියේ ප්‍රකාර දින 14 ක් ගෙවීමෙන් පසු ඉදිරියට දින 30 ක් ඇතුළතදී ආපසු භාර නොදුනහොත් එය නැති වූවාක් සේ සලකනු ලැබේ.

11. සාමාජිකයෙකු විසින් ගෙන යන ලද පොත් නැතිවුවහොත් හෝ 10 වන රීතියේ ප්‍රකාර නැතිවූවාක් සේ සලකනු ලැබුවහොත් එම පොතේ සම්පූර්ණ වටිනාකම එම සාමාජිකයා විසින් ගෙවිය යුතුය. අවශ්‍ය වුවහොත් එම සාමාජිකයාගේ මුළු තැන්පත් මුදලම හෝ ඉන් කොටසක් හෝ එසේ නැතිවූ පොතේ වටිනාකම වශයෙන් පුස්තකාලය සන්තක කරනු ලැබේ.

12. පුස්තකාලයෙන් ලබා ගත් කිසිම පොතක් කිළුටු කිරීම, ඉරි ඇඳීම හෝ පිටු ඉරා දැමීම ආදී කිසිම හානියක් නොකළ යුතුයි.

13. පුස්තකාලයෙන් කිසිම පොතක් භාරගන්නා අවස්ථාවේ එයට කිසිම හානියක් සිදුව තිබුණහොත් ඒ බව පුස්තකාලයාධිපතිට ඒ අවස්ථාවේදීම දැනුම්දීම සාමාජිකයාගේ යුතුකමකි. කිසියම් සාමාජික යකු විසින් භාර ගන්නා ලද පොතක පළුදුවීමක් හෝ හානියක් සිදුවී ඇති බව එම පොත භාරගන්නා අවස්ථාවේදීම පුස්තකාලයාධි පතිට නොපෙන්වුවහොත් එම පළුදුවීම් ආදීයෙන් තොරව තිබූ පොතක් ලෙස සලකණු ලැබේ.

14. සාමාජිකයෙකු විසින් ආපසු භාර දෙන ලද පොතක් පාවිච්චි කිරීමට නුසුදුසු අන්දමට හානි පමුණුවා ඇති බවට පුස්තකාලයාධි පතිට වැටහී ගියහොත් එම පොතේ සම්පූර්ණ වටිනාකම එම සාමාජිකයාගෙන් අයකර ගැනීමට පුස්තකාලයාධිපතිට බලය තිබේ. අළුත් පොතක මිළ අයකරගත් පසු හානි සිදුවී ඇති පොතෙයි මහජන පුස්තකාලය, ද. වි. කෝ. ගම් සභාව පළුදුවීම නිසා විකුණන ලදී යන සටහන යොදා එය සාමාජිකයාට ආපසු භාර දෙනු ලැබේ.

15. (1) සාමාජිකයෙකු විසින් ගෙන යන ලද පොතක් වෙන කිසි වකුට නොදිය යුතුයි.

15. 2.15 (1) වැනි රීතිය උල්ලංඝනය කරනු ලබන යම් සාමාජිකයකු වෙතොත් ඔහුගේ තැන්පත් මුදල පුස්තකාලය සන්තක කොට ඔහුගේ සාමාජිකත්වයද අවලංගු කරනු ලැබේ.

15. (3) සාමාජික ප්‍රජාමංඩලයක් විසින් පුස්තකාලයෙන් ලබා ගන්නා ලද පොතක් හෝ පොත් එකී ප්‍රජා මංඩලයේ ලියා පදිංචි සාමාජිකයිනට හැර වෙනත් කිසිවකුට නොදිය යුතුයි.

15. (4) (15).(3) රීතිය උල්ලංඝනය කළ යම් ප්‍රජා මංඩලයක් වෙතොත් එකී ප්‍රජා මංඩලය විසින් තැන්පත් කොට ඇති ඇප මුදල පුස්තකාලය සන්තක කොට එම ප්‍රජා මංඩලයේ සාමාජිකත්වයද අවලංගු කරනු ලැබේ.

16. බෝවෙන රෝගයකින් පෙළෙන අවධියක පුස්තකාලයෙන් පොත් ලබා නොගත යුතුයි. එසේ යමකු විසින් නොදැනුවත්ව හෝ පොත් පාවිච්චිකර තිබේ නම් ඒ බව පුස්තකාලයට වහාම දැන්විය යුතුයි. එවිට එවැනි පොතක් විනාශ කර දැමීමට තීරණය

කරනු ලැබුවහොත් ඒ වෙනුවට අළුත් පොතක් ලබා දීම හෝ පොතේ වටිනාකම ගෙවීම හෝ කළ යුතු වෙයි.

17. යම්කිසි පොතක් පළමුවෙන් ලබා ගැනීම පිළිබඳ සාමාජිකයන් අතර මත භේදයක් ඇති වුවහොත් එය නිරාකරණය කිරීම පුස්තකාලයාධිපතිට අයත් කාර්යයකි.

18. යම් සාමාජිකයකුට විශේෂ පොතක් වෙන් කරවා ගැනීම අවශ්‍ය වුව හොත් එම පොත පිළිබඳ විස්තරයක් සමග පොතකට ශත 10 බැගින් වූ වෙන් කරවා ගැනීමේ ගාස්තුවක් පුස්තකාලයාධිපතිට භාර දිය යුතුයි. එවිට එම පොත හැකිතාක් කඩිනමින් වෙන් කොට ඉල්ලුම්කරුට ඒ බව දැනුම් දෙනවා ඇත. පොත වෙන් කර තබා ඇති බව දැනුම් දී දින 3 ක් ඇතුළත දී ඉල්ලුම් කළ අය විසින් එම පොත භාරගත යුතුය. එම කාලසීමාව තුළදී වෙන් කරවා ගත් පොත භාර නොගතහොත් තව දුරටත් ඒවා වෙන් කර තැබීමට පුස්තකාලයාධිපති බැඳී නැත.

19. යම් සාමාජිකයකු ප්‍රදේශය තුළ පදිංචිය නැතිව ගියහොත් නැතහොත් එම ප්‍රදේශයේ රැකී රක්ෂා ආදියෙන් වෙන්ව ගිය හොත් ඔහුගේ සාමාජිකත්වය අවලංගු වනු ඇත. එවිට 5 වන රීතිය යටතේ ඔහු වෙත නිකුත් කර ඇති සාමාජික පත්‍රය පුස්තකාලයාධිපතිට භාර දිය යුතුය.

20. (1) යම් සාමාජිකයකු ඉල්ලා අස්වූ විට නැති නම් 19 රීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට ඔහුගෙන් පුස්තකාලයට ලැබෙන්නට තිබෙන මුදලක් වේ නම් එය ඔහු විසින් 4. (1) (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් මුදලින් අඩු කර ඉතිරි මුදල ඔහුට ගෙවනවා ඇත.

20. (2) යම් සාමාජික ප්‍රජා මණ්ඩලයක් ඉල්ලා අස්වූ විට නැත්නම් 19 රීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට එම ප්‍රජා මංඩලයෙන් පුස්තකාලයට ලැබෙන්නට තිබෙන යම් මුදලක් වේ නම් එය එකී ප්‍රජා මංඩලය විසින් 4.(4) (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් කරන ලද මුදලින් අඩු කරනු ලැබේ.

21. (1) බ්‍රහස්පතින්දා පෙරවරු හා බදාදා දිනයද, රජයේ නිවාඩු දිනයන්හි හා සභාපති තුමා විසින් නියම කරනු ලබන දිනයන්හිද හැර අනිකුත් සෑම දිනයන්හිදීම පෙරවරු 8 සිට පස්වරු 5.30 දක්වා පුස්තකාලය විවෘතව තිබේ.

21. (2) පුස්තකාලය පාවිච්චි කරන්නන්ගේ පහසුව සඳහා 21 වැනි ව්‍යවස්ථාවේ සඳහන් වේලාවන් වෙනස් කිරීම සභාවේ සභාපතිතුමාට කළ හැක. එමෙන්ම පුස්තකාලය 'වසා තබනු ලබන දිනයන්ද සාමාජිකයන්ගේ පහසුව උදෙසා වෙනස් කිරීමටද සභාපතිතුමාට පුළුවන. එසේ කළ යුත්තේ ඒ බව සාමාජිකයනට දින 7 කට පෙර දැනුම් දීමෙන් පසුවය.

22. වැසිදින වලදී වැස්සෙන් පොත් ආරක්ෂාකර ගෙනඒමට හා ගෙන යැමට සාමාජිකයා බැඳී සිටී.

### කියවීම් ශාලාව

23. කියවීම් ශාලාව පාවිච්චි කරණ සෑම කෙනෙක්ම—

(1) ඒ සඳහා පුස්තකාලයාධිපති ගෙන් නිසි අවසරය ලබා ගත යුතුය.

(2) කියවීම් ශාලාවේ තබා ඇති නාම ලේඛනයේ තමාගේ නම අත්සන් කළ යුතුය.

24. (1) පහත සඳහන් සුදුසුකම් ඇති කෙනෙකුට කියවීම් ශාලාව පාවිච්චි කිරීමට අවසරය දීමට පුස්තකාලයාධිපතිට පුළුවන :—

(1) සාමාන්‍ය ලිවීමට හා කියවීමට දැන සිටීම.

(2) ගම් සභා ප්‍රදේශය තුළ පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුළ රැකී රක්ෂාවක යෙදී සිටීම.

24. (2) බදාදා දිනය හා බ්‍රහස්පතින්දා පෙරවරුව හා රජයේ නිවාඩු දිනයන්හි හා සභාපති තුමා විසින් නියම කරනු ලබන දිනයන්හිද හැර අනිකුත් සෑම දිනයන්හිදීම පෙරවරු 8 සිට පස්වරු 5.30 දක්වා කියවීම් ශාලාව විවෘතව තිබේ.

24. (3) එසේනමුත් කියවීම් ශාලාව වසා තැබීම හෝ විවෘත්ව තැබීම සම්බන්ධයෙන් ගම් සභාවේ සභාපති තුමාට මෙහි පහත සඳහන් බලතල තිබේ :—

(අ) කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ගේ පහසුව සඳහා ඉතා අඩු වශයෙන් දින 7 කට පළමු කරන දැනුම්දීමකින් පසු 24 (2) ව්‍යවස්ථාවේ සඳහන් වේලාව වෙනස් කිරීම.

(ආ) ගම් සභාවේ සභාපතිතුමාට අවශ්‍ය යයි හැඟී යන පරිදි විශේෂ හේතුන් නිසා කියවීම් ශාලාව වෙනත් දිනයන්හිදී හා වේලාවන්හිදී විවෘත කරවා තැබීම.

(ඇ) ඉතා අඩු වශයෙන් දින 6 කට පළමු කරන දැනුම්දීමකින් පසු කියවීම් ශාලාවට අයත් බඩු බාහිරාදිය ගණන් ගැනීම සඳහා නියම කරන ලද දිනයන්හිදී කියවීම් ශාලාව වසා තැබීම.

25. කියවීම් ශාලාවට අයත් කිසිම පොතක් පතක්, සඟරාවක් සිතියමක්, ලියවිල්ලක් හෝ වෙනත් කිසියම් දේපලක් කියවීම් ශාලාවෙන් පිටතට කිසිවෙකුට ගෙන යා නොහැක.

### සාමාන්‍ය

26. බෝවන රෝගයකින් පෙළෙන කිසිම් කෙනෙකු රෝග පැතිර යාමේ කාලසීමාව ඉක්මවා යන තුරු මහජන පුස්තකාලයට හෝ කියවීම් ශාලාවට ඇතුළුවිය නො හැක.

27. (1) කියවීම් ශාලාව තුළ හෝ පුස්තකාලය තුළ හෝ ඒ අසල නොමනා අන්දමින් හෝ අනුන්ට හිරිහැර වන අන්දමින් හෝ නොහැසිරිය යුතුය.

27. (2) පුස්තකාලය හා කියවීම් ශාලාව තුළ හෝ ඒ අවට ඇති ගම් සභාව සතු ගොඩනැගිලි වලට හෝ වෙනත් දේපලවලට කිසිම අලාභහානියක් නොකල යුතුය.

27. (3) කියවීම් ශාලාව හා පුස්තකාලය වසා ඇති වේලාවන්හිදී නිකරුනේ ඒ අසල නොහැසිරීය යුතුය.

27. (4) කියවීම් ශාලාව හා පුස්තකාලය තුළ දුම්බීම හා කෙළ ගැසීම තහනම්ය.

27. (5) මහජන පුස්තකාලය තුළදී හෝ ඒ අසලදී කිසිවකු විසින් දාදු වලින් හෝ කඩදාසි වලින් සූදු කෙලීම හෝ මුදල් ඔට්ටු කිරීමෙන් කිසිම ක්‍රියාවක් කිරීම හෝ නොකළ යුතුය.

27. (6) පුස්තකාලය හා කියවීම් ශාලාව තුළ හෝ ඒ අසල කෑගැසීම හෝ සිංදුකීම හෝ වෙනත් ශබ්ද ආදිය කිරීමෙන් පුස්තකාලය හා කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුයි.

27. (7) අපිරිසිදු ලෙස කියවීම් ශාලාවට හෝ පුස්තකාලයට ඇතුළු නොවිය යුතුය.

27. (8) බල්ලන්, බළලුන් හෝ වෙනත් සතුන් පුස්තකාලය හා කියවීම් ශාලා භූමියට නොගෙන ආ යුතුය.

27. (9) මහජන පුස්තකාලය හෝ කියවීම් ශාලාව හෝ ඒ අසල නිදා ගැනීම හෝ ආහාර ගැනීම හෝ නොකළ යුතුය.

27. (10) පුස්තකාලයාධිපති විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද අයෙකු විසින් මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නීත්‍යානුකූලව කරනු ලබන කටයුතු වලට කිසිවෙක් බාධා නොකළ යුතුය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවල ප්‍රධාන තුමා හෝ සභාපති තුමා යනු වෙන් දකුණු විලච්චිය කෝරළේ ගම් සභාවේ සභාපති තුමාද, පුස්තකාලයාධිපති වශයෙන් දකුණු විලච්චිය කෝරළේ ගම් සභාව මගින් පත් කර ඇති පුස්තකාලයාධිපති හෝ පුස්තකාල සහායකද, ගම් සභාව යනුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු විලච්චිය කෝරළේ ගම් සභාවද අදහස් කරනු ලැබේ.

ඩබ්ලිව්. අප්පුහාමි,
සභාපති තැන,
ද. වි. කෝ. ගම් සභාව.

1973. 10. 19 වන දින,
නොච්චියාගම ගම් සභා කාර්යාලයේදීය.

11–34—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

## මෙගොඩපොත ගම්සභාව—ඌරාපොල

### ගම්සභා ආඥපනත—257 අධිකාරය

මෙගොඩපොත ගම් සභාව විසින් 15.08.1973 දින පැවැත්වූ මාසික සභා රැස්වීමේදී ගම්සභාවට අයිති පාරවල් සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ගත් බව මෙයින් මහජනයා වෙත දැනුම් දෙනු ලැබේ.

**අංක 8/15.08.1973—යෝජනාව : ගම් සභාවට අයිති පාරවල්**

1952 අංක 6 දරණ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥපනතේ තුන්වන වගන්තියේ, පළමුවන උප වගන්තිය යටතේ මෙගොඩපොත ගම්සභාව විසින් වර්ෂ 1954 ක්වූ ජූලි මස 2 දින අංක 10,689 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරණ යෝජනාවෙන් සම්මත කරගන්නා ලද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා හතරවන කාණ්ඩයේ පළමුවන අතුරු ව්‍යවස්ථාව යටතේ 1960 ඔක්තෝබර් 14 දින අංක 1,22,212 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවා ඇති පාරවල් හා අඩිපාරවල් වලට අමතරව මෙහි පහත සඳහන් පාරවල් ද, ඉදිරියෙන් දක්වා ඇති නියම දිග, පළල, අනුව සෑදීම සහ ප්‍රතිසංස්කරණය කිරීම කළ යුතුයයි ද, එසේ ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කරමින් ලිඛිත දැන්වීමක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මෙගොඩපොත ගම්සභාවේ සභාපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුයයි ද, එසේ විරුද්ධවාදී කම් ඉදිරිපත් නොකල හොත්, මෙහි පහත දක්වා ඇති පරිදි දිග, පළලින් යුතුව එකී පාරවල් නඩත්තු කළ යුතුයයි ද, යනුවෙන් වී. කේ. ඇස්. ජයවර්ධන මහතා විසින් කරණ ලද යෝජනාව ඇස්. ඒ. ඇම්. ඒ. ඩී. ආරියවංශ මහතාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

### පාරවල් ලේඛනය

| | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 1. | රතඹලේ-කොන්ගහවත්ත පාර ... | 2,275 ... | 12 |
| 2. | ඔපන්ඇල්ල-කොස්වත්ත පාර ... | 2,660 ... | 16 |
| 3. | ඔපන්ඇල්ල-අම්බලන්ගොඩ පාර ... | 2,650 ... | 16 |
| 4. | අලිවලපල්ල වත්ත හරහා ඇති පාර ... | 4,625 ... | 11 |
| 5. | ලාවුළුපිටිය මිනිපිටි පාර ... ... | 850 ... | 12 |
| 6. | වරාගොඩ නාන මංකඩ පාර ... ... | 725 ... | 15 |

ආර්. ඇම්. ඇස්. ඇස්. රාජකරුණා,
මෙගොඩපොත ගම් සභාවේ
සභාපතිතැන.

1973 ඔක්තෝබර් මස 18 වැනි දින,
මෙගොඩපොත ගම්සභා කාර්යාලයය,
ඌරාපොල.

11–43—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## යටියන්තොට නගරය

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම් ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බව ගෝ ඝාතක ආඥපනතේ (සංශෝධිත ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය ප්‍රකාර යටියන්තොට නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරෝධතාවයක් දැක්වීමට අදහස් කරන යටියන්තොට නගර සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට ඔහුගේ හෝ ඇගේ විරෝධතාවය සඳහා හේතු පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින්, මෙම ගැසට් පත්‍රයේ සඳහන් දින සිට දහහතර (14) දිනක් ඇතුළත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

### උපලේඛණය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය |
|---|---|
| 1. ඇස්. ඇල්. ඇම්. සමින් ලෙබ්බේ | යටියන්තොට පොදු වෙළඳ පොළේ අංක 1 දරණ හරක් මස් කඩ කාමරය. |
| 2. ඇන්. ඩී. ඇම්. සක්කාෆ් | යටියන්තොට පොදු වෙළඳ පොළේ අංක 2 දරණ හරක් මස් කඩ කාමරය. |
| 3. ඇස්. ඇල්. ඇම්. සමින් ලෙබ්බේ | යටියන්තොට නගර සභා පොළ අසල අංක 3 දරණ හරක් මස් කඩ කාමරය. |
| 4. ඒ. ඇල්. සිත්තිසහුරා | යටියන්තොට පොදු වෙළඳ පොළේ අංක 1 දරණ එළු මස් කඩ කාමරය. |
| 5. ඇස්. ඇල්. ඒ. සත්තාර් | යටියන්තොට පොදු වෙළඳ පොළේ අංක 2 දරණ එළු මස් කඩ කාමරය. |

නීල් ඩයස්,
විශේෂ කොමසාරිස්,
යටියන්තොට නගරය.

1973 ඔක්තෝබර් මස 23 දින,
යටියන්තොට නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී.

11–159—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ මිණුවන්ගොඩ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත (272 අධිකාරය)

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1974 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාම පිණිස බලපත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බලපත්‍රය නිකුත් කිරීම ගැන මිණුවන්ගොඩ ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වන අධිකාරය) 7 (2) (ආ) වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| අංකය | ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. ... | ඇම්. ෂරීප් ... | යටියන ගමේ පිහිටි මෝලවත්ත නොහොත් තේක්කවත්ත ... | ... හරක් මස් හා එළු මස් වෙළඳාම |

එස්. ඩී. එල්. ජයවර්ධන,
මිණුවන්ගොඩ ගම් සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 22 වන ද,
මිණුවන්ගොඩ ගම්සභා කාර්යාලයේ දී ය.

11–228—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

**1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

**2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.**

**3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.**

**4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.**

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශන යන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.**

**6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.**

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

**8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.**

**9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.**

**10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

**අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.**

**11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

**13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—**

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ජෙදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ජෙද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබෙ නම්)**

| | මිළ රු. | ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ජෙදයක් ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ජෙදයක් ... | 0 | 60 | 0 | 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා** දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයක් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දැයක මුදල් භාර නොගනී.** සියළුම දැයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් පත්‍රෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය | හා වේලාව |
|---|---|---|---|---|---|
| **ඔක්තෝබර්** | ... | 73.10.05 සිකුරාදා | ... | 73.09.28 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.10.12 සිකුරාදා | ... | 73.10.05 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.10.19 සිකුරාදා | ... | 73.10.12 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.10.26 සිකුරාදා | ... | 73.10.19 සිකුරාදා | දවල් 12.00 |
| **නොවැම්බර්** | ... | 73.11.02 සිකුරාදා | ... | 73.10.26 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.11.09 සිකුරාදා | ... | 73.11.02 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.11.16 සිකුරාදා | ... | 73.11.09 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.11.23 සිකුරාදා | ... | 73.11.16 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.11.30 සිකුරාදා | ... | 73.11.23 සිකුරාදා | දවල් 12.00 |
| **දෙසැම්බර්** | ... | 73.12.07 සිකුරාදා | ... | 73.11.30 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.12.14 සිකුරාදා | ... | 73.12.07 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.12.21 සිකුරාදා | ... | 73.12.14 සිකුරාදා | දවල් 12.00 |
| | | 73.12.28 සිකුරාදා | ... | 73.12.21 සිකුරාදා | දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1973 මැයි මස 04 වැනි දින,**
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.